Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ගැටුම් ව්‍යාවර්තනයෙහිලා සංවර්ධන ආධාරවල භූමිකාව: බලගැන්වුම් ක්‍රියාවලි පහසු කිරීම සහ ප්‍රජාව ගොඩනැංවීම

ක්‍රිස්ටීන් බිග්ඩන් සහ බෙනෙඩික්ට් කෝර්ෆ් (Christine Bigdon, Benedikt Korf)

www.berghof-handbook.net



1. හැඳින්වීම 438

2. III පථයේ ක්‍රමෝපා සහ සංවර්ධන සහයෝගිතාවේ භූමිකාව 439

3. බලගැන්වුම් (ස්ථානීය) තර්කය සහ සංවර්ධන නියෝජිතායතන තර්කය 444

කළමනාකරණ තර්කය 444

බලගැන්වුම් (ස්ථානීය) තර්කය 446

සංවර්ධන නියෝජිතායතන තර්කය 450

4. විවිධ කතිකා ඇසුරුකරගත් බලගැන්වුම 451

5. ප්‍රජාව ගොඩනැංවීමේ සන්දර්භය තුළ සහභාගිත්වය සහ බලගැන්වුම 455

6. ක්‍රියාත්මකවීමේ ඉඩකඩ 464

7. නිගමනය : සංකීර්ණ ආපදාවලදී සංවර්ධන නියෝජිතායතන දේශපාලන ක්‍රියාකාරීන් ලෙස 474

8. ආශ්‍රිත ග්‍රන්ථ හා වැඩිදුර කියැවීම් 476

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ගැටුම් ව්‍යාවර්තනයෙහිලා සංවර්ධන ආධාරවල භූමිකාව: බලගැන්වුම් ක්‍රියාවලි පහසු කිරීම සහ ප්‍රජාව ගොඩනැංවීම

ක්‍රිස්ටීන් බිග්ඩන් සහ බෙනෙඩික්ට් කෝෆ් (Christine Bigdon, Benedikt Korf)

## 1. හැඳින්වීම

මෙම පරිච්ඡේදයේ දී අවධානය යොමු කරනු ලබන්නේ න්‍යායාත්මක උපකල්පන සහ බලාපොරොත්තු යන කාරණා දෙකට මෙන් ම සංවර්ධන ආධාර ක්ෂේත්‍රය ඇතුළත බලගැන්වීමේ ප්‍රවේශයන් සම්බන්ධයෙන් වන ප්‍රායෝගික අත්දැකීම්වලටය. එහිදී ගැටුම් ව්‍යාවර්තන කාර්යයන් සහ ඒවා සතු හැකියාවන් ගැන විශේෂ අවධානය යොමු කරනු ඇත. කතුවරුන් විසින් තම කරුණු ගොඩනැගීමට යන්නේ සංවර්ධන ප්‍රතිපත්ති පිළිබඳ මෑතක දී ඇති වූ කතිකාවන් හෙවත් මත ප්‍රකාශයන් පදනම් කරගෙනය. මෙහිදී සාකච්ඡා කරනු ලැබුවේ අර්බුද වැළැක්වීමේ සහ ගැටුම් ව්‍යාවර්තනයේ දී සංවර්ධන සහයෝගතා ක්‍රියාවලියට කෙතරම් දුරට සාර්ථක අන්දමින් දායක විය හැකිද යන්න ගැනයි.



ගැටුම් ව්‍යාවර්තනයට දායක වීමේ කාර්යයේදී සංවර්ධන ආධාරවල භූමිකාව පිළිබඳ වත්මන් සමාජයේ කෙරී ගෙන යන අදහස් හුවමාරු කර ගැනීම්වල දී මූලික වශයෙන් ඉලක්ක වී ඇත්තේ එකිනෙකට සම්බන්ධ ප්‍රවේශයන් තුනක ඇති සාපේක්ෂ්‍ය ශක්තීන් හා දුර්වලකම්ය.

- ඇන්ඩර්සන් (1999) විසින් වර්ධනය කර තිබෙන *'වරදක් නොකරනු'* යන ප්‍රවේශය මූලික වශයෙන් බලාපොරොත්තු වන්නේ හොඳට වඩා වැඩි වරදක් කිරීමෙන් වැළැකී සිටීමයි. එමෙන්ම සංවර්ධන ආධාර හේතුකොට ගෙන ඇතිවන නිෂේධනීය බලපෑම් ගැන අතිශයින් සැලකිලිමත් වෙයි. එහිදී පෙන්වා දෙන්නේ මෙම සංවර්ධන ආධාර බොහෝ විට ගැටුම් නිරාකරණ කිරීමට දායක වනවාට වඩා තීව්‍ර කිරීමට හේතුවන බවයි. මෙම ප්‍රවේශය ගොඩනංවනු ලබන්නේ සංවර්ධන ක්‍රියා සඳහා වන ඇමෙරිකානු රාජ්‍ය නොවන සංවිධාන එකමුතුව (සීඩීඒ) මගින් යුරෝපය, ආසියාව, අප්‍රිකාව සහ ලතින් ඇමෙරිකාවේ ගැටුම් පවත්නා කලාප 13 ක කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයකින් ලබාගන්නා ලද පරිපූර්ණ වූ අත්දැකීම් මතය.

- *සාමය සඳහා වන ස්ථානීය හැකියාවන්* වශයෙන් (ඇන්ඩර්සන් 1999), හෙන්රිච් 1999) හඳුන්වනු ලබන ප්‍රවේශය බලාපොරොත්තු වන්නේ සංවර්ධන ආධාර මාර්ගයෙන් ගැටුම් ව්‍යාවර්තනය සඳහා ඉදිරිපත්වීමට හැකි වේ යැයි සිතිය හැකි මාර්ග හඳුනා ගැනීමයි. ඉන් පසුව කෙරෙන නිර්දේශ වන්නේ ආධාර සපයන බටහිර නියෝජිතායතන සාමය සඳහා වන ස්ථානීය හැකියාවන් කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි. මෙම සංකල්පය හඟවන්නේ සාමය බැහැරින් ආරෝපණය කළ නොහැකි බවයි; එය සාක්ෂාත් කරගත යුත්තේ සමාජය තුළින්මය.

- සාමය සහ ගැටුම්වල බලපෑම තක්සේරු කිරීම පිළිබඳ කතිකාව (පී. සී. අයි. ඒ.) ගැටුම් සන්දර්භය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක අවශ්‍යතාව අවධාරණය කරයි. මෙයින් සාමය ගොඩනැංවීම සඳහා පාදක ව්‍යුහයක් ඉදිරිපත් කරනු ලැබේ. එම ව්‍යුහය සාමය සහ ගැටුම්වල බලපෑම තක්සේරු කිරීම සහ ඇගැයීම සඳහා ක්‍රමවේදයක් වර්ධනය කරයි (මේ සඳහා මෙහි මාක් හොෆ්මන්ගේ ලිපියත්, බුෂ් 1998; රෝස් සහ රොත්මන් 1999 බලන්න).

මෙම පරිච්ඡේදය යොමු කරනු ලබන්නේ ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයේ සංකීර්ණ හදිසි අවස්ථා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික සහන සහ සංවර්ධන ව්‍යාපෘතිවලින් ලබාගන්නා ප්‍රායෝගික අත්දැකීම් පිළිබඳවයි. එක් අතකින් ගැටුම් ව්‍යාවර්තනයත් අනික් අතින් සහභාගීත්ව සහ බල-ගැන්වීමේ ප්‍රවේශයත් අතරේ ඇති බැඳීම කතුවරුන් විසින් ගවේෂණය කරන අතරතුර, ඔවුන් විසින් ප්‍රජාව ගොඩනැංවීම තුළ පොදු බලගැන්වීමේ ප්‍රවේශයන්හි හැකියාව විශ්ලේෂණාත්මකව තක්සේරුවකට භාජනය කරනු ඇත. මෙය හානියක් ඇතිවීම වැළැක්වීම පමණක් නොව ප්‍රාදේශීය තලයේ ගැටුම් ව්‍යාවර්තනය සඳහා සෑහෙන දායකත්වයක් ලබාදීම සඳහා ද වේ. මෙම පරිච්ඡේදයේ ආනුභවික පදනම රඳා පවතින්නේ ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් ඇළලී ගිය ප්‍රදේශවල ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික සංවර්ධන සහයෝගිතා ක්‍රියාවන්ට අදාළ සහභාගීත්ව පර්යේෂණ සහ අත්දැකීම් තුළය.

II වන සහ III වන කොටස් ගැටුම් ව්‍යාවර්තන කතිකාවේ මෑතකදී මතු වී ඇති කරුණු ගවේෂණය කරනු ඇත. එහිදී සංකීර්ණ හදිසි අවස්ථාවලදී සංවර්ධන ආධාරවල භූමිකාව පිළිබඳව අවධානය යොමු කරනු ඇත. IV වන සහ V වන කොටස් ප්‍රජා සංවර්ධනය ක්ෂේත්‍රය තුළ සහභාගීත්ව සහ බලගැන්වීමේ සාමාන්‍ය ප්‍රවේශ කිහිපයක් හඳුන්වා දෙනු ඇත. එහි දී ඒවායේ ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීම්ද පැහැදිලි කර දෙනු ඇත. VI වන ඡේදයෙන් විශ්ලේෂණාත්මකව සාකච්ඡා කරනු ලබන්නේ ක්‍රියාවන් අතර තිබිය හැකි කාල පරාසයන් මෙන්ම, සංකීර්ණ වූ හදිසි අවස්ථා තුළ සංවර්ධන ආධාර හරහා බලාත්මක කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීමේ දී මුහුණ පෑමට සිදුවිය හැකි බාධක, උභතෝකෝටික සහ ප්‍රතිවිරුද්ධ මත යනාදියයි. බලාත්මක කිරීමේ ප්‍රවේශ සම්බන්ධයෙන් වූ හැකියා, බාධක සහ විවිධ මත දැරීම් පිළිබඳව අනාගත අපේක්ෂා සඳහන් කරමින් පරිච්ඡේදය අවසන් කරන කතුවරු බලාත්මක කිරීමේ සහ පිළිගැනීමේ ක්‍රියාවලිය මගින් වඩාත් බද්ධගත ප්‍රජාව ගොඩනැංවීමේ යෙදී සිටින විට සංකීර්ණ වූ හදිසි අවස්ථාවල දී සංවර්ධන ආධාර සඳහා බලවත් දේශපාලන භූමිකාවක් නිර්දේශ කරති.



## 2. පථ III උපාය මාර්ග සහ සංවර්ධන සහයෝගතාවේ භූමිකාව

ගැටුම්වල මැදිහත්වීම් සම්බන්ධයෙන් පැවැත්වෙන වත්මන් සාකච්ඡාවට ප්‍රධාන කතිකාවන් තුනක් අයත් වේ. ඒ හැම එකක්ම විවිධ තලයන් සහ ක්‍රියා මාර්ග වෙත යොමු වෙයි; ඒවා විවිධ න්‍යායාත්මක සාකච්ඡා මත ගොඩනැංවෙනු ලැබේ. ගැටුම් තේරුම් ගැනීමේ ආකාරය ද විවිධ වෙයි; ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ විවිධ උපාය මාර්ග එක් එක් අය විසින් නිර්දේශ කරනු ලැබේ.

- *ගැටුම් බේරුම්කර ගැනීම පිළිබඳ කතිකාවත* සාකච්ඡා කරනු ලබන්නේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන් අතර, ගිවිසුමක ආකාරයෙන් සන්නද්ධ ගැටුමක් අවසන් කිරීමට ඉඩකඩ සලසා දිය හැකි අවසානයන්

ලබාදීමේ ස්වරූපයක් ගත් සියලු උපාය මාර්ග පිළිබඳවයි. එහෙත් අවශ්‍යයෙන්ම එයට පදනම් වූ හේතු සාකච්ඡා කරනු නොලැබේ. මෙහි දී - පථ I මූලික වශයෙන් රාජ්‍ය තාන්ත්‍රික හා රජයේ පාර්ශවයන්ගේ රාජකාරීමය සහ විධිමත් ක්‍රියාකාකරකම්වලට වෙන් කර ඇත. ඒ අනුව එය සංවර්ධන ආධාර සම්බන්ධයෙන් වූ මෙම ලිපියට සැලකිය යුතු තරම් ප්‍රස්තුත වන්නේ නැත.

- *ගැටුම් නිරාකරණය* පිළිබඳ කතිකාවන් එහි අවධානය යොමු කර ඇත්තේ ඍජු සංස්කෘතික හා ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට පාදක වූ හේතු සාකච්ඡා කිරීමේ දී ඉලක්ක කරගත් පද්ධතියකට නැඹුරු වූ ක්‍රියාකාරකම් වෙතය. මෙහි දී එනම් පථ-II හිදී ක්‍රියාකාරීවන ආකාරය වන්නේ රාජකාරී මට්ටමෙන් බැහැරව යන බලයෙන් නම්මා ගැනීම්වලින් තොර වූ රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ සාමාන්‍ය පරිදි මැදිහත්වීමයි. සාමාන්‍යයෙන් මෙවැනි ක්‍රියාවලි මෙහෙයවන්නන් වනුයේ ජාත්‍යන්තර සහ/හෝ දේශීය ගැටුම් නිරාකරණ කටයුතුවල යෙදී සම්බන්ධතා පවත්වාගැනීමේ සහ සිවිල් කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වීමේ විශේෂ දක්ෂකම් ඇති අයයි. ප්‍රශ්න විසඳීමේ වැඩමුළු වැනි මාධ්‍යයන් ප්‍රයෝජනයට ගනී. අධ්‍යයන ආයතන සහ ගැටුම් විශ්ලේෂණයෙහි නිරතව සිටින සිවිල් සමාජ කණ්ඩායම්වල සහයෝගය මොවුන්ට ලැබේ.

- *ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳ කතිකාවත* යොමු වී ඇත්තේ දීර්ඝ කාලීන ව සාමය ගොඩනැංවීමේ ප්‍රයත්න වෙතය. එය ප්‍රතිලාභ ක්‍රියාවලි හා ව්‍යුහාත්මක වෙනස්කම් වෙතද නැඹුරු වී ඇත. අනාවරණය වී ඇති ඍජු, සංස්කෘතික සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය මැඩ පැවැත්වීම ඒවායේ අරමුණයි. ඒ අතරම අයුක්ති සහගත සමාජ සම්බන්ධතා ව්‍යාවර්තනය සහ අන්‍යොන්‍ය ව උපකාරීවන සම්බන්ධතා ගොඩනැංවීමට උපකාරීවන පරිසරයන් ප්‍රවර්ධනය කිරීම ද, අරමුණු අතර වේ. මෙහිදී පථ III ට පාත්‍රවන පිරිස වශයෙන් සැලකෙන ආකෘතික වශයෙන් දේශීය වූ බිම් මට්ටමේ සංවිධාන මෙන්ම දේශීය හා ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතන සහ රාජ්‍ය නොවන සංවිධාන ප්‍රචණ්ඩ ගැටුම් හේතුකොට ගෙන වැඩියෙන්ම පීඩාවට පත් කොටස්වලට ඍජුවම ආමන්ත්‍රණය කරති. ඔවුහු බිම් මට්ටමේ පුහුණු කිරීම්, ධාරිතා ගොඩනැංවීමේ ක්‍රියාවලි සහ බලගැන්වීමේ කටයුතු, චිත්ත කම්පන චිකිත්සක ක්‍රියා, මානව හිමිකම්, සවර්ධන කටයුතු සහ මානව හිතවාදී ආධාර කටයුතුවල යෙදෙති.



මෙම කතිකාවන් තුන සහ ඒවායේ සඳහන් මැදිහත්වීමේ ක්‍රමෝපායයන් ඇත්ත වශයෙන්ම බලවත්සේ එකිනෙකට බැඳී පවතී. ඒවායින් බලාපොරොත්තු වන්නේ ස්ථානගත සාම ජන කණ්ඩායම් සහිත කොට්ඨාස හෝ විවිධ ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර ක්‍රියාකාරීන් අතර, උපාය මාර්ගික සංධාන නම් උපාය මාර්ගයන් තුනම අන්‍යොන්‍ය වශයෙන් සමෝධානමය බවත්, අනුපූරක බවත් තේරුම්ගෙන, තලයන් තුනේදීම ක්‍රියාකාරකම් එකිනෙකට සම්බන්ධ කිරීම එය ක්‍රියාත්මක කරන අය විසින් කළ යුතු වේ.

සංකීර්ණ වූ හදිසි තත්ත්වයන් යටතේ සංවර්ධන ආධාර පිළිබඳ කාරණය අරබයා වඩාත් අදාළ වන්නේ ගැටුම් ව්‍යාවර්තනය පිළිබඳව වූ තුන්වන කතිකාවයි. ගැටුම් ව්‍යාවර්තනයට දායකවීම සඳහා සැලසුම් කරන ලද යෝජිත මැදිහත්වීම් අරබයා සංවර්ධන ආධාර ක්‍රියා කළ යුතු යෝග්‍ය කාර්යභාරය පිළිබඳව තවදුරටත් අවබෝධ කරගත යුතු දේ ආර්ථික, සහයෝගතා සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයේ සංවර්ධන ආධාර කමිටුවේ ගැටුම්, සාමය සහ සංවර්ධන සහයෝගතා සඳහා වූ

මෙහෙයුම් නිර්ණායකයන් මගින් සපයා දී ඇත. පළමුව, අපි ගැටුමේ විවිධ අවධි සහ ගතිකත්වය අතර, පවත්නා තත්ත්වයන් හඳුනාගත යුතු වෙමු. මේ හැම එකකටම වෙනස්වන්නා වූ මැදිහත්වීම් අවශ්‍ය වේ. සංවර්ධන ආධාර කම්ටුව එකිනෙකට සම්බන්ධ වන්නා වූ අවධි නිරූපණය කරනු ලබයි.

- *යටපත් වූ ආතති සහිත අවස්ථා*
- *මතුවෙමින් පවතින ආතති සහිත අවස්ථා*
- *විවෘත ගැටුම් සහ ප්‍රචණ්ඩ ගැටුම් පුපුරා යන අවධි*
- *දුර්වල සංක්‍රාන්ති සහ පශ්චාත් ගැටුම් අවස්ථා*

කෙසේ වුවද යථා තත්ත්වය සාමාන්‍යයෙන් වඩාත් සංකීර්ණ වෙයි (කොටුව 01 බලන්න). බොහෝ විට අපගේ අත්දැකීම් වී ඇත්තේ එක් තත්ත්වයකින් තවත් තත්ත්වයකට යමින් අනපේක්ෂිතව සිදුවන වෙනස්වීම්ය. බොහෝ රටවල ලක්ෂණය වී ඇත්තේ එකම අවස්ථාවක සාමය සහ ගැටුම යන තත්ත්වයන් දෙකම පැවතීමයි. ඒ හේතුකොට ගෙන ඕනෑම ආකාරයක නිශ්චිත තර්කයකට අනුව අනුක්‍රමික වශයෙන් එකිනෙකට පසුව එන ස්ථාවර තත්ත්වයන්ට වඩා විවිධ ගැටුම් සන්දර්භ හෝ අවස්ථා ගැන සඳහන් කිරීම වඩාත් අනුකූලවන බව පෙනේ. එවැනි තත්ත්වයක් යටතේ ආතති වර්ධනය කරන්නා වූ සූචකයන් නිරීක්ෂණය කිරීමට ගැලපෙන උපකරණවලින් ආධාර ආයතන සන්නද්ධ වී සිටිය යුතු වේ. ඒ අනුව වෙනස්වන තත්ත්වයන්ට අනුකූලවන හා සුනම්‍යව හැඩගැසීමට ඔවුන්ට හැකිවනු ඇත.



**කොටුව 1 : විවිධ ගැටුම් සන්දර්භ සහ පසුබිම්**

ශ්‍රී ලංකාවේ සංවර්ධන මැදිහත්වීම් සාමාන්‍යයෙන් සිදුවන්නේ උතුර සහ නැගෙනහිර යුද්ධයෙන් ඇළලී ගිය ප්‍රදේශවලය. මෙහි දී විවිධ වූ, ස්ථානයට ආවේණික තත්ත්වයන් ගණනාවක් පවතී. මෙහි දෙමළ ඊළාමය සඳහා වූ විමුක්ති කොටින්ගේ (එල්. ටී. ටී. ඊ) පාලනය යටතේ පවතින මුදා නොගත් ප්‍රදේශ පවතී. ශ්‍රී ලංකා හමුදාවේ බල අධිකාරිය යටතේ මුදාගත් ප්‍රදේශ ඇත. තවද අර්ධ වශයෙන් මුදා නොගත් ප්‍රදේශ ද වේ (මායිම් ප්‍රදේශ). මෙම ප්‍රදේශවල විශේෂයෙන්ම රාත්‍රී කාලයේදී විවෘත ගැටුම් නිරන්තරයෙන්ම පවතී. මෙම තත්ත්වය හදිසියේම, කෙටි කාල සීමාවක් තුළ දී වෙනස්විය හැකිය. එනම් උත්සන්න වෙමින් පවතින ආතති තත්ත්වයෙන් ප්‍රචණ්ඩ ගැටුමක් කරා යා හැකිය. රටේ වෙනත් ප්‍රදේශවල සංවර්ධන මැදිහත්වීම් සිදුවන්නේ 'පෙර ගැටුම් පසුබිම්' යයි නිර්වචනය කර ඇති (යටපත් කරන ලද ආතති තත්වයන් සහිත) ප්‍රදේශවලයි. එනම් වතුකරය වැනි ප්‍රදේශයයි. එහි දෙමළ වතු කම්කරුවන් හා සිංහල වතු කළමනාකාරීත්වය අතර අනන්‍යතා පිළිබඳව හා කම්කරු ප්‍රශ්න පිළිබඳව ගැටුම් උත්සන්නවීමේ භව්‍යතාවක් ඇත. රටේ දකුණු කොටසේ සංවර්ධන ව්‍යාපෘති යථා පරිදිම මැදිහත් වී ඇත්තේ පශ්චාත් ගැටුම් ප්‍රදේශවලය. රජයේ හමුදා මගින් මැඩ පවත්වන ලද වාමාංශික පක්ෂයක් වන ජනතා විමුක්ති පෙරමුණේ (ජේ. වී. පී.) ප්‍රචණ්ඩ කැරැල්ලට මූලික වූ හේතු නිරාකරණය කිරීමක් මෙහිදී සිදු වී නැත.

මෙම ගැටුම්වල පසුබිම සහජ ගතික බැවින් විවිධ ආකාරයේ මැදිහත්වීම්, එනම් හදිසි සහන, පුනරුත්ථාපනය සහ සංවර්ධන මෙහෙයුම් නිරන්තරයෙන් ම සමගාමීව සිදු වේ. ඒකාන්තයෙන්ම මේ කාරණය හේතුකොට ගෙන බොහෝ ආධාර ආයතන සංවර්ධනයට නැඹුරු වූ හදිසි ආධාර සංකල්පය හඳුන්වාදීමට ඉදිරිපත් වී ඇත. මෙහි දී සහන කටයුතු, මධ්‍යකාලීන සහ දීර්ඝකාලීන සංවර්ධන ප්‍රයත්නයන් සමග ඒකාබද්ධ කර ඇත. විශේෂයෙන් ම ගැටුම් ව්‍යාවර්තනය කෙරෙහි බලපෑමත් ඇති කිරීම සඳහා මෙම ආයතන දැන් මානව හිතවාදී උදව්, දුප්පත්කම සහ තිරසාර සංවර්ධනය ආදී සාම්ප්‍රදායික විධි සහිත සමස්ත වූ සම්ප්‍රදායික ප්‍රවේශයක් ගැනීමට සොයා බලයි (මෙම වෙළුමේ මාක් හොෆ්මන්ගේ ලිපිය බලන්න).

සංවර්ධන ආධාර කමිටුවේ මෙහෙයුම් නිර්ණායක තුළ (OECD/ DAC 1997. P.9) සංකීර්ණ වූ හදිසි අවස්ථාවල දී සංවර්ධන ආධාරවල භූමිකාව පහත සඳහන් ආකාරයෙන් නිර්වචනය කර ඇත:

> *සංවර්ධන සහයෝගතා ප්‍රයත්නයන් උත්සාහ ගත යුත්තේ තිරසාර සංවර්ධනය සඳහා පදනම වශයෙන් ව්‍යුහාත්මක ස්ථායීතාවයකින් යුත් පරිසරයක් ඇති කිරීම සඳහාය. ව්‍යුහාත්මක ස්ථායීතාවයකින් යුත් පරිසරයක් යනු ප්‍රචණ්ඩත්වයට යොමු නොවී වෙනස්වීම් කළමනාකරණය කර ගැනීමට හැකි ගතික සහ ආදර්ශක සමාජ සහ දේශපාලන ව්‍යුහයන්ගෙන් සමන්විත දෙයකි (............) දීර්ඝ කාලීන වශයෙන් ගත් කල, ගැටුම්වල හේතු මූලයන් මර්දනය කිරීම සහ සාමකාමී මාර්ගවලින් ආරවුල් කළමනාකරණය කිරීමට සහ නිරාකරණය කිරීමට හැකියාව ඇති ආයතන දියුණු කිරීමට එයට දායක විය හැකිය.*



සංවර්ධන මැදිහත්වීම් යොමු විය යුත්තේ හවුල් වී සිටින රටවල පවත්නා සාමාන්‍ය ආර්ථික සහ සමාජ වාතාවරණය වඩා යහපත් බවට පත් කිරීම, රාජ්‍යයේ නීත්‍යානුකූලභාවය සහ සඵලතාව වැඩි දියුණු කර ගැනීම සඳහා වන ආධාරක ක්‍රියාමාර්ග මෙන්ම ශක්තිමත් සිවිල් සමාජයක් මතුවීමට ආධාර කිරීම ආදිය වෙතයි. තිරසාර සංවර්ධනයක් සඳහා වූ පදනමක් වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහාත්මක ස්ථාවරභාවයක් ප්‍රවර්ධනය කිරීම මේ ආකාරයෙන් පහසු කරනු ලබන්නේ ව්‍යාපෘති ක්‍රියාවට සහභාගීකත්ව සහ බලගැන්වීමේ ප්‍රවේශ හඳුන්වාදීමෙනි. සමස්ත අභිප්‍රාය වන්නේ විවිධ සමාජයීය කණ්ඩායම් එකට එකතු කිරීමයි. විශේෂයෙන් නොවැදගත් සේ සලකා කොන් කරන ලද හෝ ප්‍රචණ්ඩත්වයට තදබල ලෙස එරෙහි වන්නා වූ කාන්තාවන් වැනි කොටස් මෙයට අයත් වෙති. ඔවුහු ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සහ සාකච්ඡා, සම්බන්ධයෙන් වූ තීරණ ගැනීමේ ක්‍රියාවලිවලට ද එකතු කරගත යුතුවෙති. සමාජය ඇතුළත තිබෙන්නාවූ තරගකාරී පක්ෂපාතකම්වලට ඉඩකඩ ලබාදීම සඳහා අවශ්‍යවන්නාවූ ආයතන සහ යාන්ත්‍රණයන් වැඩි දියුණු කිරීම මෙන්ම සමාජ-දේශපාලන ආරාවුල් සාමකාමීව කළමනාකරණය කිරීමට ද මෙම සංවර්ධන මැදිහත්වීම් මගින් බලාපොරොත්තු වේ (එම 18 පිටුව). සංවර්ධන ආධාර කමිටුවේ මෙහෙයුම් නිර්ණායකයන් තවදුරටත් මෙසේ කියා සිටී. "ප්‍රජාතාන්ත්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම යන ක්‍රියාව මතුපිටින් පෙනෙන්නේ සංකීර්ණ, ක්‍රමික සහ සහභාගීත්ව ක්‍රියාවලියක් ලෙසයි. එහි දී ප්‍රජාව, සිවිල් සමාජය සහ රාජ්‍යය, සම්මතයන්,

ඇගැයුම් සහ ආයතන පද්ධතියක් නිර්මාණය කරයි. එසේ කරනු ලබන්නේ ඔවුන් සම්බන්ධතාව අපේක්ෂා කළ හැකි, නියෝජනයක් ඇති වන පරිදි සහ සාධාරණ ආකාරයෙන් මැදිහත්වීම සඳහාය" (එම 38 පිටුව).

මෙයින් තේරුම් යන්නේ සංවර්ධන ආධාර විවිධ තලයන් කෙරෙහි යොමු කරවීමේ අවශ්‍යතාවයයි. තවද, ප්‍රජාව පදනම් කරගත් සංවිධාන ඇතුළත් ප්‍රජා තලය, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත් ප්‍රජා තලය සහ පළාත් පාලන ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත් අතරමැදි තලය ද මෙයට ඇතුළත් වේ. ඒ අතරම මැදිහත්වීමේ සමස්ත උපාය මාර්ග සඳහා ගැටුම් සන්දර්භයේ මහා පරිමාණ පැතිකඩ ද සැලකිල්ලට ගනු ලැබේ. එය ප්‍රධාන සමාජ ප්‍රවාහයේ යෙදී සිටීම ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කළ යුතුය. නමුත් ඒ අතරම රාජ්‍ය නොවන සංවිධාන සමග ප්‍රජාව පදනම් කරගත් සංවිධානවල සහ පළාත් පාලන ආයතනවලට සේවය කිරීම සඳහා වඩාත් හොඳින් ප්‍රතිචාර දැක්වීමට උදව් කළ යුතු වේ. සංවර්ධන මැදිහත්වීම් කාර්යයයේ විවිධ ගැටුම් පැතිකඩ පළමුවන රූපසටහනින් පෙන්නුම් කෙරේ. එහිදී මහා පරිමාණ ගැටුම් සහ ග්‍රාමීය ප්‍රජාව අතර පවත්නා අන්තර් සම්බන්ධතා ඉස්මතු කොට දක්වා ඇත.

සංවර්ධන ආධාර කමිටුවේ මෙහෙයුම් නිර්ණායකයන් අවධාරණය කරන්නේ ප්‍රජා තලයේ දී සාමය ගොඩනැංවීම සහ සමගිය යළි ස්ථාපනය කිරීම සඳහා අඛණ්ඩ හා දීර්ඝ කාලීන සහයෝගීතාවක අවශ්‍යතාවයි. එපමණක් නොව කලාපීය ආයතනික තලයේ දී යහ පාලනය සඳහා වන සාමය ගොඩනැංවීමේ මූලික කරුණු ශක්තිමත් කිරීමට සමගාමී සහ අඛණ්ඩ ප්‍රයත්නයන් ද අවශ්‍ය බව අවධාරණය කෙරේ.

ප්‍රජාව ගොඩනැංවීමේ කාර්යයේ දී සාමාන්‍යයෙන් යොදාගනු ලබන සහභාගීකත්ව සහ බලගැන්වීම් ප්‍රවේශ දෙස වඩාත් සමීපව බැලීමට පෙර ගැටුම් ව්‍යාවර්තනයේ දී න්‍යායාත්මක යම් සහයෝගයන් පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කළ යුතු වේ. එහි දී විශේෂයෙන්ම (ප්‍රාදේශීය) බලගැන්වීම් පිළිබඳ තර්කය සංවර්ධන නියෝජිතායතන තර්කය සමග කෙතරම් දුරට සංගත වන්නේද යන්න ගවේෂණය කළ යුතු වේ.

චිත්‍රය 1 : මහා පරිමාණ ගැටුම් සහ ග්‍රාමීය ප්‍රජාවන් අතර, අන්තර්-සම්බන්ධතාව






## 3. (ස්ථානීය) බලගැන්වීමේ තර්කය සහ සංවර්ධන නියෝජිතායතන තර්කය

ගැටුම් කළමනාකරණය යන පදය බොහෝ විට පාවිච්චි කරනු ලබන්නේ ප්‍රතිඵල බලාපොරොත්තු වන සියලු ප්‍රවේශයන් සඳහා වූ ආවරණ සංකල්පයක් වශයෙනි. මෙම පරිච්ඡේදයේ දී කතුවරුන් අනුගමනය කරන්නේද එම ක්‍රියාමාර්ගයයි. අනෙක් අතට ගැටුම් ව්‍යාවර්තනය, ගැටුම් කළමනාකරණය පිළිබඳ තර්කයෙන් (ස්ථානීය) බලගැන්වීම පදනම් කරගත් තර්කයට මාරුවීම සාමාන්‍යයෙන් ඒකාබද්ධ කරගනී. සංකීර්ණ වූ හදිසි අවස්ථාවල දී සංවර්ධන ආධාරවල කාර්යභාරය සම්බන්ධයෙන් මෙම මාරුවීම න්‍යායාත්මක උපකල්පන පිළිබඳ කිසියම් සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. විශේෂිත වශයෙන් අදාළ වන දෙයක් වන්නේ (ස්ථානීය) බලගැන්වීම පිළිබඳ උපකල්පනය කර ඇති තර්කය කොතරම් දුරට සංවර්ධන නියෝජිතායතනය පිළිබඳව පෙන්නුම් කර ඇති තර්කය සමග ඒකඟත්වයක් දරන්නේද යන ප්‍රශ්නයයි.

### 3.1 කළමනාකරණය පිළිබඳ තර්කය

ගැටුම් සම්බන්ධයෙන් මැදිහත්වීම විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රයෝජනවත් එක් පාදක ව්‍යූහයක් රොක්මන් සහ ප්‍රිඩ්මන් (2001) සපයා දී ඇත. මෙම ප්‍රවේශය විවිධ ගැටුම් ආකෘති දක්වයි: සම්පත් ගැටුම්, අපේක්ෂා, ගැටුම් සහ අනන්‍යතා ගැටුම් වෙන්කොට හඳුනාගනු ලබයි. ප්‍රභේදය ඉහත

හඳුන්වා දෙන ලද එකිනෙකට වෙනස් ගැටුම් කතිකාවන්වල තර්කය අනුගමනය කරයි (ගැටුම් සමථය, ගැටුම් නිරාකරණය සහ ගැටුම් ව්‍යාවර්තනය). ප්‍රස්තුත කාරණය වන්නේ එකිනෙකට වෙනස් ගැටුම් වර්ග තුනක් තිබීම නොව සෑම ගැටුමක් ම ව්‍යුහයන් තුනේම මානයන් පැහැදිලි කිරීමයි. ඕනෑම ගැටුමක පැහැදිලිවම දෘශ්‍යමාන නොවන මානයන් ඇත්තටම රඳා පවතින්නේ කෙනෙකු එය තේරුම් ගන්නා ආකාරයට හා ඒවා දෙස බලන ආකාරයටයි.

- *සම්පත් ගැටුම් ව්‍යුහය* විසින් ගැටුම් දකින්නේ අවම වූ සමාජ තත්ත්වය, බලය සහ සම්පත් සඳහා හිමිකම් පෑමේ දී ඇතිවන අරගලයක් ලෙසිනි. ගැටුමක් තේරුම්ගනු ලබන්නේ ඍණාත්මක බලවේගයක් ලෙසිනි; එය තර්ජනයක් හෝ රෝගයක් වැන්නකි. එය භෞතික භාණ්ඩ, ආර්ථික ලාභ ප්‍රයෝජන, දේපළ සහ බලය සඳහා පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර ඇතිවන තරගකාරීත්වයේ ස්වභාවික ප්‍රතිඵලයකි. මෙම ව්‍යුහය තුළ ප්‍රචණ්ඩත්වයට විකල්පයක් වශයෙන් ඇති එකම දෙය වන්නේ කිනම් ආකාරයක හෝ සාකච්ඡා කිරීමේ, කේවෙල් කිරීමේ ක්‍රියාවලියක් මගින් සියලු පාර්ශවයන් අන්‍යෝන්‍ය වශයෙන් සෑහීමකට පත්වන පරිදි සම්පත් නැවත බෙදාහරින තෙක් මෙම ක්‍රියාවලිය පැවතීමයි. අවසන් ප්‍රතිඵලය වන්නේ සාමාන්‍යයෙන් කිසියම් ආකාරයක ජය / පරාජය හෝ එකඟතාවකට එළඹීම් තත්වයකි. එය ගැටලු සහිත වන්නේ මෙම සම්පත් ව්‍යුහය තුළ ගැටුමට පාදක වූ හේතු ඉතිරිවන අතර, ඒවා ගැන තීරණයකට පැමිණීමක් සිදු නොවීමයි. සැලකිල්ලට භාජනය නොකරන ලද ගැඹුරු වූ ප්‍රශ්න හදිසියේ පුපුරා මතු විය හැකිය.



- *අපේක්ෂා ගැටුම් ව්‍යුහය* විසින් තරගකාරී සම්පත් ව්‍යුහගත කිරීමේ මතය නිෂ්ප්‍රභා කරයි. ගැටුම්, සම්පත්වලට ඇති ඉල්ලුම වශයෙන් සැලකිය හැකි නමුත් ප්‍රකාශිත කේවෙල් කිරීමේ තත්ත්වයන් හුදෙක්ම අඩු හෝ වැඩි වශයෙන් ස්ථිරවම අපේක්ෂා ප්‍රකාශ කිරීම් වේ. එය යමෙකුට 'අවශ්‍යතා, අභිලාෂයන් සහ භීති' වශයෙන් නැවත නිර්වචනය කළ හැකිය (ෆිෂර් සහ උෟරි 1981).

- *විකල්ප ආරාවුල් නිරාකරණය* පිළිබඳ මත දරන පිරිස අපේක්ෂා පදනම් කරගත් කේවල් කිරීමේ ක්‍රියාවලියක් වර්ධනය කර ඇත. එය අවධානය යොමු කරනු ලබන්නේ එක් එක් පාර්ශවය සත්‍ය වශයෙන්ම හා නීත්‍යානුකූලව සොයන දෙය පිළිබඳව නිරවුල් අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳවයි. ඊට පසු පාර්ශවයන් දෙකේම අපේක්ෂා පිළිබඳව සෑහීමකට පත් කළ හැක්කේ කෙතරම් ප්‍රමාණයකට ද යන වගත් සොයා බලන උපරිම තත්ත්වයකට ගෙන ඒම සඳහා විරුද්ධවාදීන් සමග ක්‍රියා කිරීමට නිර්මාණාත්මක උපක්‍රම යොදනු ලැබේ.

- *අනන්‍යතා ගැටුම් ව්‍යුහය*

වැඩි වශයෙන් මතු වී ඇත්තේ මෙල්ල කර ගැනීමට දුෂ්කර වාර්ගික ගැටුම් පිළිබඳව ක්‍රියා කිරීමට ගන්නා ලද ප්‍රයත්නයන්ගෙනි. එය ඉල්ලා සිටින්නේ ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුමේ ස්ථිතික බලය අරබයා විකල්ප ප්‍රවේශයක් වන දේශපාලන මොඩලයයි (රොක්මන් සහ ෆිරීඩ්මන් 2001).

මෙහිදී ගැටුම යනුවෙන් හඳුනාගෙන ඇත්තේ එක් එක් පාර්ශවයේ අවශ්‍යතා, අභිලාෂයන් සැලකිලිමත්වීම් සහ බිය යන අංශයන්ගේ ස්වභාවික අතිරේක වර්ධනයක් ලෙසිනි.

අපේක්ෂා ව්‍යුහය ගැටුම් සම්බන්ධයෙන් වඩාත් සුබවාදී මතයක් ලබාදෙයි. එවැනි සාකච්ඡාවක නිරතවීම ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ට ඔවුන්ගේ අපේක්ෂා සහ සංජානනයන් පැහැදිලි කර ගැනීමට සාමාන්‍යයෙන් උපකාරී වෙයි. එමෙන් ම අනෙක් පාර්ශවයේ සිටින අයත් වඩාත් හොඳින් තේරුම් ගැනීමට ද හැකිවනවා ඇත. මෙම ව්‍යුහය සම්බන්ධයෙන් තිබෙන්නා වූ ප්‍රධාන විවේචනය වන්නේ අන්‍යෝන්‍ය වශයෙන් සතුටුදායක එකඟතාවක් සොයාගැනීමේ ප්‍රයත්නයේදී වඩාත් සාර්ථක බව පෙනී යන නමුත්, අපේක්ෂා පදනම් කරගත් ගැටුම් නිරාකරණය මඟින් බොහෝ විට ගැටුමේ මතුපිටට යටින් පවතින්නා වූ ස්වභාවය සඟවා දැමිය හැකිවීමයි. මේ ආකාරයේ ගැටුම් නිරාකරණය ඉලක්ක කරගනු ලබන්නේ තනි සහ සාමූහික ක්‍රියාකාරී මූලෝපායයන් වෙනසකට ලක් කිරීමයි. එහෙත් එක් එක් පාර්ශ්වය තුළ පාදක ව පවතින අගයන් සහ සම්මතයන් මූලික වශයෙන් වෙනසකට භාජනය නොවී ඉතිරි වෙයි.

සම්පත් ව්‍යුහය (ගැටුම් සමථ කතිකාව) සහ අපේක්ෂා ව්‍යුහය (ගැටුම් නිරාකරණ කතිකාව) යන දෙකම ගත් කල ඒවායේ අභ්‍යන්තරයේ ගැටුම් කළමනාකරණය පිළිබඳ තර්ක ඇත. මෙම විශ්ලේෂණයේ දී අප උපකල්පනය කරනු ලබන්නේ ගැටුම්වල ඕනෑම අවසන් නිරාකරණයක් අතාත්වික බවයි. එබැවින් ප්‍රයත්නය යොමුවිය යුත්තේ ගැටුම් කළමනාකරණය සහ එය පැතිරීම වළක්වාලීම කෙරෙහිය. එකඟත්වයක් ළඟා කර ගැනීම හෝ දෙපාර්ශවයම සෑහීමකට පත් විය හැකි ජයග්‍රාහී අවස්ථා හේතු කොට ගෙන ප්‍රචණ්ඩත්වය පසෙක ලා තැබිය හැකි තත්වයක් ඉලක්ක කරගනිමින් විරුද්ධවාදීන් එක් තැනකට ගෙන ඒමට සකාර්ය මාර්ග සොයාබැලීමට සඳහා ද ප්‍රයත්න දැරිය යුතු වේ. වඩාත් සාර්ථක වූ ගැටුම් නිරාකරණ කතිකාව යොමුවන්නේ තත්ත්වයන් නැවත ව්‍යුහගත කිරීම සහ දෙපාර්ශවයම සෑහීමක පත්විය හැකි ජයග්‍රාහී අවස්ථා පිළිබඳවයි. එසේ කරනු ලබන්නේ මේ ආකාරයෙන් ගැටුම් කළමනාකරණය කිරීමට තවමත් වෙහෙස ගන්නා අතරවාරයේය. ගැටුම් කළමනාකරණ තර්කය මූලික වශයෙන් ගැටුම් පිළිබඳව ක්‍රියා කිරීම සඳහා වන අවස්ථානුකූල උපක්‍රමයකි. එහිදී ගැටුමට මූලික හේතු සහ පාදක වූ ගැටුම් සම්බන්ධ පාර්ශවයන්ගේ ඇගැයුම්, සම්මතයන් සහ බියජනක හැඟීම් අවශ්‍යයෙන්ම සෙවීමක් වන්නේ නැත.



### 3.2 (ස්ථානීය) බලගැන්වීමේ තර්කය

රොක්මන් සහ ප්‍රීඩ්මන්ගේ තුන්වන ව්‍යුහය වන *අනන්‍යතාව* (ඕනෑම ගැටුම් ව්‍යාවර්තන කතිකාවක් සඳහා අත්‍යවශ්‍යය) ගැටුම් කළමනාකරණ තර්කයෙන් (ස්ථානීය) බලගැන්වීමේ තර්කය වෙත ආදර්ශයට ගත හැකි විස්ථාපනයක් ලෙස බද්ධ වේ. මෙම ආකෘතිය පිළිගනු ලබන කරුණක් වන්නේ මෙල්ල කර ගැනීමට නොහැකි ගැටුම් වැඩි ප්‍රමාණයක් නියමාකාරයෙන් තනි පුද්ගලයන්ගේ සහ සාමූහික අනන්‍යතා පිළිබඳ උද්වේගකාරීව ප්‍රකාශ කිරීම සහ ගැටුමක ස්වරූපයෙන් ඉදිරිපත්වීම් ආදිය බවයි. එවැනි ගැටුම්වල මූලාශ්‍රය සොයාගත හැක්කේ තදින් මුල් බැසගත් මානුෂික අවශ්‍යතා වන අභිමානය, පිළිගැනීම, සුරක්ෂිතභාවය, පාලනය, අභිප්‍රාය සහ සඵලත්වය යානාදියට තර්ජනයක් ඇති වූ විට හෝ

හෝ ඒවා නොලැබීම හේතු කොට ගෙන ඇතිවන ඉච්ඡාභංගත්වය තුළය (අසාර් 1990 ඃ බර්ටන් 1990) අනන්‍යතා ව්‍යූහය ඇතුළත ක්‍රියාකරන විශ්ලේෂකයන් ගැටුම්, නිරාකරණ කළ යුතු ප්‍රශ්න හැටියට නොදකී. වඩා නිවැරදිව ප්‍රකාශ කරන්නේ නම්, ඔවුන් තර්ක කරන්නේ ගැටුම් වර්ධනයට සුදුසු පරිදි හැඩගැසීමට සහ ඉගෙනීමට අවස්ථා සලසා දෙන බවයි. ගැටුම් හේතුකොට ගෙන සියලු පාර්ශවයන්ට ඔවුන්ගේ අවශ්‍යතා සහ ඇගැයීම් ඔවුන් විසින්ම පැහැදිලි කර දීමට ඉඩකඩ සැලසිය හැකිය. ඒ අනුව ඔවුන්ට අසන්තෝෂය හෝ සන්තෝෂය ඇතිවීමට හේතු වඩා හොඳින් තේරුම් ගැනීමට ගැටුම් ප්‍රයෝජනවත් වේ (බරුච් බුෂ් ගැන ෆොල්ගර් 1994).

එබැවින් ගැටුම් සම්බන්ධ කටයුතුවල යෙදී සිටීමේ දී පාරාවර්තික සංවාද එයට බද්ධ කරගත යුතු වේ. මෙහි දී ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් තම ප්‍රතිවාදීන් ඉදිරියේ දී තමන්ගේ අවශ්‍යතා සහ අගයන් ගැන විවෘතව කතා කරනු ලැබේ. එසේ වන්නේ කුමන ආකාරයක හෝ සාකච්ඡා සාර්ථක වීමේ බලාපොරොත්තු ඇති කර ගැනීමට පෙරාතුවය. *පිළිගැනීමට ලක්වීම සහ බලගැන්වීම* මුඛ්‍ය ක්‍රියාවලි වේ. අන් අයගේ පැහැදිලි ලෙස කරුණු ඉදිරිපත් කිරීම් සහ ආත්මාධිරෝපණය පිළිගැනීම මගින් ගැටුම ඒ ආකාරයෙන් ව්‍යාවර්තනය සහ බලගැන්වීම සඳහා අවස්ථාවක් ලබාදෙයි. අනන්‍යතා ව්‍යූහයේ යථා දර්ශය අනුව මැදිහත්වීමේ අරමුණ එකඟත්වවලට හෝ විසඳුම්වලට එළැඹීම පමණක් නොවේ. ඇත්ත වශයෙන්ම ගැටුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලියෙන් පෙනී යන්නේ සාමය සඳහා ස්ථානීය හැකියාවන් ගොඩනංවන අතරම, පවතින තත්ත්වයට (පාර්ශවයන් ඇතුළුව) අභියෝගයක් එල්ල කිරීමට අවස්ථාවක් ලෙසිනි. (රොත්මන් සහ පිච්මන් 2001)

(ස්ථානීය) බලගැන්වීමේ තර්කය උඩු අත් ක්‍රමෝපායයන් මත අවධාරණය රඳවයි. එය ඉලක්ක කරගන්නේ සමාජ යුක්තිය උදෙසා සහයෝගයට නොඅඩු වන හෝ ස්ථානීය අරගල පවා ජනිත කරවන්නා වූ තත්ත්වයකි. ඒ හේතුවෙන් ම ඉලක්කය රැඩිකල් වූ ව්‍යූහාත්මක වෙනස්වීමක් සඳහා වේ. ගැටුම් ව්‍යාවර්තනය මේ අනුව ප්‍රචණ්ඩ නොවූ ක්‍රියාදාමයකින් සමන්විත න්‍යායාත්මක පාදක ව්‍යූහයක් මත ගොඩනැංවේ. එය ගැටුම දකින්නේ සමාජ යුක්තිය සඳහා වන ප්‍රචණ්ඩත්වයෙන් තොර අරගලයක් ලෙසයි. පෙළපාලි, වැඩ වර්ජන හෝ වැඩට සහයෝගය නොදැක්වීම ආදියෙන් ප්‍රකාශ කරනු ලබන ප්‍රචණ්ඩකාරී නොවන අරගලය, සමාජමය සහ ව්‍යූහාත්මක වෙනසක් ඇති කිරීම සඳහා ජනතාවගේ බලය නිශ්චිතව විදහාපෑමකි.

ගැටුම් ව්‍යාවර්තන කතිකාවේ සඳහන්වන කල් පවතින්නා වූ ප්‍රචණ්ඩකාරී ගැටුම් එබැවින් තේරුම්ගනු ලබන්නේ අසමාන සහ පීඩාකාරී දේශපාලන ව්‍යූහයන්ගේ ස්වභාවික ප්‍රතිඵලයක් ලෙසයි. ඒ (ප්‍රචණ්ඩකාරී ගැටුම්) පිළිබඳ සාර්ථකව කටයුතු කිරීම යනු ඒ නිසා ප්‍රචණ්ඩ නොවන අරගලයක ස්වරූපයෙන් නොවැදගත් සේ සලකා කොන් කරන ලද කණ්ඩායම් බලගැන්වීම් සහ පිළිගැනීම ඉල්ලා සිටීමකි. ස්ථානීය තලයේ පවත්නා ක්ෂණික අවධානය යොමුවිය යුතු කරුණු පිළිබඳව ක්‍රියා කිරීමට හැකිවන්නේ මේ ආකාරයෙන් පමණි. නැතිනම් ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට සහ අවංකභාවය පදනම් කරගත් සාකච්ඡාවලට එළඹීම සඳහා පථ I (සහ පථ II හි) ක්‍රියාකාරීන් මත අවශ්‍ය බලපෑම් ඇති කිරීමට ද හැකි වේ (රෙයිමන් මෙම වෙළුමේ). පථ III හි ක්‍රමෝපායයන් කරනු ලබන්නේ මේ තාක් කල්

බොහොමයක් සාකච්ඡාවලින් ඉවත් කර තබන ලද සිවිල් ජනතාව සහ ඔවුන්ගේ ප්‍රචණ්ඩ නොවන අරගලවලට ඇති ඉඩකඩ අවධානයට ලක් වන තත්ත්වයට ගෙන ඒමයි. ඒ අනුව එම කොටස ස්ථානීය සාම ක්‍රියාවලියේ ප්‍රධාන පාර්ශ්වකරුවකු බවට පත් වේ.

ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශය පිළිබඳව ඒත්තු ගැන්වෙන කරුණක් වන්නේ එයින් අත්වන ප්‍රතිඵලය, ක්‍රියාවලිය සහ වෙනස්වීමේ හැඩගැසීමයි.

- ගැටුම් ව්‍යාවර්තනයේ අවසාන ඉලක්කය වන්නේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ මතු පිටින් පවතින්නා වූ අවශ්‍යතා සහ හිමිකම් විසින් මතු කරන ලද ස්ථිර පදනමක් සහිත කරුණු සම්බන්ධයෙන් බේරුම්කාර තත්ත්වයක් ළඟා කර ගැනීමයි (*ප්‍රතිඵලවලට අනුරූපව හැඩගැසීම*). මෙයට සෘජුව සම්බන්ධවන කරුණු දෙකක් ඇත.
- පළමුවැන්න *ක්‍රියාවලිය අනුව හැඩගැස්වීමයි*. මෙයින් තේරුම්ගත යුත්තේ පාර්ශ්වයන් අතර සහයෝගය සහ සන්නිවේදන හැකියාව ඇති කිරීම ඔවුන් අතර තිබෙන අන්‍යොන්‍ය අසුභවාදී ගැටුම් ආකල්ප සහ ඇගැයීම් භෞතික වශයෙන් වෙනස් කිරීමට මැදිහත්කරුවන්ට අවශ්‍යවනු ඇත.
- දෙවැන්න, *වෙනස්වීම්වලට අනුකූලව* හැඩගැසීමයි. අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම් බලගැන්වීම සහ පිළිගැනීමට ලක් කිරීම සඳහා නව ව්‍යූහයක් නිර්මාණය කිරීමට ඇති පැහැර හැරිය නොහැකි දේශපාලන කාර්යය එය හඳුනාගනී. ඒ අනුව ගැටුමට සෘජුවම සම්බන්ධ පාර්ශවයන්ගේ ඕනෑකම්වලටත් වඩා ඔබ්බට ගොස් සමාජ යුක්තිය අභිවර්ධනය කිරීම සහ සවිමත් කිරීම සිදු වේ.



(ස්ථානීය) බලගැන්වීම් තර්කයේ දී ක්‍රියාකාරී වන අන්දම සැලකිල්ලට ගෙන ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශය පෙනී යන්නේ එය අසීමිත දිගුකාලීන බහු පථ සහ ගතික ක්‍රියාවලියක් බවයි. ඒ හේතුකොට ගෙන එයට සම්බන්ධ වී සිටින ක්‍රියාකරුවන්ගේ විෂය පථය පුළුල් කරයි. පුද්ගලික හා අනුෂාංගික තලයන්හි දී මූලික අවශ්‍යතාවන් සම්බන්ධයෙන් සෑහීමකට පත් කිරීම ගැටුම් ව්‍යාවර්තනය සඳහා ප්‍රමාණවත් නොවන බව ඔවුන් තේරුම්ගන්නා බැවින්, දිගු කාල සීමාවක් තුළ කෙරෙන සමාජ ප්‍රතිසංස්කරණ සහ සමගිය යළි ස්ථාපනය කිරීම අරමුණු කරගෙන විශාල ප්‍රමාණයේ ව්‍යූහාත්මක අසමානතා ගැන අවධානය යොමු කිරීමට හැකිවන පරිදි සම්පත්වලට සමානතාවයකින් යුතුව ළඟාවීමේ සහ ව්‍යූහයන් එකලස් කිරීමේ පුළුල් වූ ඉලක්කයට ළඟාවීම සඳහා ද ක්‍රියාකාරීන් කටයුතු කළ යුතුය (එම).

**රූපසටහන 2 : බලගැන්වීම සහ පිළිගැනීම විවිධ ගැටුම් ව්‍යුහයන් සහ කතිකාවන් පෙන්වා දෙන පරිදි**




රොක්මන් සහ ප්‍රිඩ්මන් (2001) පෙන්වා දෙන්නේ සම්පත් ව්‍යුහය සහ ගැටුම් පිළිබඳ අපේක්ෂා ව්‍යුහයන් බොහෝ ක්‍රියාකාරීන්ගේ හා පර්යේෂකයන්ගේ සිතුම් පැතුම් කෙරෙහි නිරන්තර බලපෑමක් ඇති කරන බවයි. ඒ අතරම මෙම සම්ප්‍රදායානුකූල ප්‍රජාව නොකඩවාම නව චින්තනයකට සහ වඩාත් නවීකරණය වූ ප්‍රවේශයන්ගේ වර්ධනයට සීමා පනවයි. ගැටුම්වලට පාදක වූ හේතු සම්බන්ධයෙන් ක්‍රියාකාරී ව කටයුතු කිරීම සහ පාදක වී තිබෙන්නා වූ සම්මතයන්, ඇගැයුම්, බලාපොරොත්තු සහ 449

හිතීන් වඩාත් හොඳින් තේරුම් ගැනීමට ගැඹුරෙන් සොදිසි කරනවාට වඩා ගැටුම් වැලැක්වීමට හෝ අඩු කිරීමට ක්‍රමෝපායයන් ඉදිරිපත් කිරීම ගැන සාමාන්‍යයෙන් විශේෂඥයෝ අඛණ්ඩව පක්ෂපාතී බවක් දක්වති. අනන්‍යතා ව්‍යුහය අපට මතක් කර දෙන්නේ සාර්ථක ගැටුම් මැදිහත්වීම් පළමුව සන්නිවේදනය සහ සංවාදය සඳහා අවස්ථා සහ ඉඩකඩ නිර්මාණය කළ යුතු බවයි. ඊට පසු අන්‍යෝන්‍ය පිළිගැනීම් සහ බලගැන්වීම් ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසිය යුතු වේ.

රූප සටහන 2 පැහැදිලි කර දෙන්නේ ගැටුම් ව්‍යුහයන් සහ බලගැන්වීම සඳහා වන ක්‍රමෝපායයන් අතර ඇති මෙම සම්බන්ධතාවයි. බලගැන්වීම වන අතර ගැටුම් කළමනාකරණය ගැටුමට සම්බන්ධ පාර්ශවයන් බලගැන්වීම කෙරෙහි අවශ්‍යයෙන්ම අවධානය යොමු නොකරයි.

## 3.3. සංවර්ධන නියෝජිතායතන පිළිබඳ තර්කය

ගැටුම්, සාමය සහ සංවර්ධන සහයෝගතාව සඳහා වූ සංවර්ධන ආධාර කමිටුවේ මෙහෙයුම් නිර්ණායකයන් සහභාගීත්ව සහ බල ගැන්වීමේ ක්‍රියාවලි සඳහා පරිපූර්ණව පහසුකම් සැලසීමේ දී සංවර්ධන ආධාරවල කාර්යභාරය නිරූපණය කර ඇත. ජර්මානු තාක්ෂණ සහයෝගතා සංවිධානයේ (ජී. ටී. ඉසෙඩ්) සංකල්ප ලියවිල්ලේ සඳහන් වන පරිදි ගැටුම් වැළැක්වීම සහ ගැටුම් කළමනාකරණය සඳහා ප්‍රධාන ක්‍රමෝපායයන් වන්නේ, අ) ව්‍යුහමය ස්ථාවරභාවයක් නිර්මාණය කිරීම සහ ආ) අදාළ කණ්ඩායම් සහ ආයතනවල ගැටුම් ව්‍යාවර්තන හැකියාවන් ප්‍රවර්ධනය කිරීමයි (ජීටී ඉසෙඩ් 2001) දෙවනුව සඳහන් කළ යෝජනාව බලාපොරොත්තු වන්නේ සමහර කණ්ඩායම්වල බලගැන්වීමට උත්තේජනයක් සපයන්නා වූ සහභාගීත්ව ක්‍රියාවලි හෝ ආයතන සඳහා ධාරිතා වර්ධනය ගොඩනැංවීම යනාදියයි. සංවර්ධනයට නැඹුරු වූ හදිසි ආධාර මැදිහත්වීම් සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කළ යුත්තේ සහභාගීත්ව සහ බලගැන්වීම් ප්‍රවේශ සම්බන්ධයෙන් පුහුණුවක් ලබා ඇති වෘත්තීයවේදීන් විසිනි. එම ප්‍රවේශයන් වන්නේ සහභාගීත්ව ග්‍රාමීය ඇගැයීම් හා සමාජ සජීවීකරණ ක්ෂේත්‍රයන්ය (ඊළඟ කොටස බලන්න).

අලංකාර වචනවලට සීමා වූ සංවර්ධන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රායෝගික අත්දැකීම්වලට වෙනස් වූ ස්වරූපයන් ගන්නේ නම් ගැටුම් ව්‍යාවර්තන ක්‍රමෝපායේ අවශ්‍යතා සංවර්ධන ආධාරවලින් ඉෂ්ට කරගත හැකි බව පැහැදිලිව පෙනේ. කෙසේ වුවද අප විසින් තර්ක කරනු ලබන්නේ සංවර්ධන නියෝජිතායතන පිළිබඳ තර්කය, විශේෂයෙන් සඳහන් කරන්නේ නම් ද්වි පාර්ශිකව ආධාර සපයන අය, (ස්ථානීය) බලගැන්වීමේ තර්කයට වඩා ගැටුම් කළමනාකරණ තර්කය සමග වඩාත් හොඳින් ගැලපේ. අය වැය ප්‍රතිපාදනය සහ අරමුදල් වැය කිරීමේ වැඩපිළිවෙල පිළිබඳ පීඩනය යටතේ ආධාර නියෝජිතායතන ස්වභාවයෙන්ම ක්‍රියාවලි සහ වෙනස්වීම වැනි කරුණුවලට වඩා අවසන් ප්‍රතිඵලය කෙරෙහි වඩාත් නැඹුරුවීමට ඉඩ ඇත. ඒ අනුව බලගැන්වීම බොහෝ විට තේරුම් ගනු ලබන්නේ උපකාරී සාධකයක් පිළිබඳ වූ හැඟීමක් තුළිනි. මේ හේතුකොට ගෙන අයවැය ප්‍රතිපාදන වැනි වැදගත් ප්‍රශ්නවල දී අවශ්‍ය තීරණ ගැනීමේ බලය ලබා නොදී ජනතාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට බද්ධ කිරීමට ව්‍යාපෘති කළමනාකරුවන්ට සිදුවෙයි. ප්‍රජා තලයේ හෝ ප්‍රජාභ්‍යන්තර තලයේ පවතින ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවහිර වන ගැටුම් ප්‍රධාන වශයෙන් පෙනී යන්නේ බාධාවන් හෝ ප්‍රමාද කිරීමේ සාධක ලෙසයි; මෙවැනි ගැටලු හැකි ඉක්මනින් ඉවත් කිරීම අවශ්‍ය වේ.

ගැටුම් කළමනාකරණය මගින් තරගකාරී කණ්ඩායම් අතර පිළිගත හැකි සමගි සම්මුතියක් සොයාගැනීමට ගන්නා වූ ඕනෑම උත්සාහයක් ඒ අනුව සංවර්ධන නියෝජිතායතන තර්කය උපයෝගී කර ගැනීමට බොහෝ විට ඉඩකඩ තිබේ. දුෂ්කර වූ බලගැන්වීම් සහ පිළිගැනීමේ ක්‍රියාවලි සඳහා දිගුකාලීන පහසුකම් සැලසීමේ තර්කයට සම්බන්ධ ඉලක්කය කරා ළඟාවීමට ඔවුන්ට හැකි නොවනු ඇත. එහි දී ගැටුම්වලට පාදක වී තිබෙන මූලික කරුණු සොයා බැලීමට ඔවුහු අසමත් වෙති. ඊට හේතුවන්නේ ඔවුන් කණ්ඩායම්වල ඇගැයුම් සම්මතයන් සහ භීතීන් ගවේෂණය කිරීමය. ව්‍යාපෘතිවල බලපෑම් පිළිබඳව ගැඹුරු ඇගැයීමක් කිරීම බොහෝ විට පැහැර හරිනු ලබන බැවින් ආධාර දෙන නියෝජිතායතනය බොහෝ විට අනුගමනය කරන්නේ සරල වූ ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය බැවින් මෙහි දී ව්‍යාපෘතිවල බලපෑම තිරසාර වී ද යන ප්‍රශ්නයට විශේෂ අවධානයක් යොමුවන්නේ නැත.

ව්‍යාපෘති කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය බොහෝ විට ප්‍රදේශයේ ප්‍රශ්න විශ්ලේෂණය කිරීමේ සහ ක්ෂණිකවම කෙටිකාලීන විසඳුම් නිර්මාණය කිරීමේ අවසානය නොපෙනෙන ක්‍රියාවලියකට ගොදුරු වේ. ප්‍රදේශයේ ජනතාව සමග කතා කිරීමට හා ඔවුන්ගේ අදහස්වලට ඇහුම්කන් දීමක් සිදු නොවේ. ආධාර සපයන නියෝජිතායතන අවසානයේ දී ස්ථානීය ධාරිතා වර්ධනය ශක්තිමත් කිරීම සහ තීරණ ගැනීම් සම්බන්ධව අවකාශයන් නිර්මාණය කිරීම වෙනුවට ප්‍රජාව මත විසඳුම් බලයෙන් පැටවීමේ අන්තරාදායක තත්ත්වයක් බොහෝවිට ඉස්මතු වීමට ඉඩ ඇත.

ස්ථානීය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය වැදගත් තීරණ ගැනීමේ ක්‍රියාවලිවලට බද්ධ කර නොහැකි තරමින් තත්ත්වය අයහපත් අවස්ථාවලදී ධූරාවලියට අතිශයින්ම සීමාවෙමින් හා ප්‍රජාතන්ත්‍රවාදී නොවන අන්දමට ආධාර සපයන නියෝජිතායතන තම තමන්ම සංවිධාන වෙති. ඔවුන්ගේම අභ්‍යන්තර ක්‍රියා පටිපාටිය තුළට මූලික ප්‍රජාතන්ත්‍රවාදී නියමයන් පවා අනුගත කරගත නොහැකි බව තමන්ම ඔප්පු කරගෙන ඇති අවස්ථාවකදී මෙම නියෝජිතායතනවලට මේ ආකාරයේ ව්‍යුහයක් සමග ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලි සහ කණ්ඩායම් බලගැන්වීම උත්තේජනය කළ හැකිද යන කාරණය ඇත්ත වශයෙන්ම ප්‍රශ්නයකට භාජනය විය යුතු කරුණකි.

ගැටුම් ව්‍යාවර්තනයට දායකවීමේ කාර්යයේ දී ඔවුන්ගේ හැකියාව විචාරාත්මකව ඇගැයීමට අවස්ථාව ලබාගැනීම සඳහා අපි දැන් සංවර්ධන ආධාරවල පොදු සහභාගීත්ව සහ බලගැන්වීමේ ප්‍රවේශයන්හි න්‍යායාත්මක අවබෝධය සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ගැන සලකා බලමු.

## 4. විවිධ කතිකාවන් අනුසාරයෙන් බලගැන්වීම පැහැදිලි කිරීමක්

සංවර්ධනයට නැඹුරු කතිකාවේ සන්දර්භය අනුව නියත වශයෙන් *බලගැන්වීම* යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක්ද? සාමාන්‍යයෙන් පාවිච්චි වන නිර්වචන මොනවාද? ඊටත් වඩා බලගැන්වීමේ ක්‍රියාවලි සාර්ථක අයුරින් ප්‍රායෝගික ක්‍රියාවට නඟන්නේ කෙසේද? විශේෂයෙන්ම සංවර්ධන ආධාර සාකච්ඡාව සමග සංසන්දනය කරන විට ගැටුම් ව්‍යාවර්තන කතිකාවේ බලගැන්වීම නිර්වචනය කර ඇති විවිධ ආකාර ගැන අපි නැවත වරක් බලමු. සංකීර්ණ දේශපාලනමය හදිසි අවස්ථාවල දී තමන්ගේ ම ක්‍රියාකාරකම් සහ ක්‍රියාවන් ඉදිරියට ගෙන යාම සඳහා ප්‍රයෝජනවත් විය

හැකි මැදිහත්වීමේ කතිකාවේ වර්ධනය කර ඇති පරිදි බලගැන්වීම පිළිබඳ මතවලින් සංවර්ධන සහයෝගිතාව ගැන උගත හැක්කේ මොනවාද?

*ගැටුම් ව්‍යාවර්තන කතිකාවේ* පෙන්වා දී ඇති පරිදි ප්‍රචණ්ඩ ගැටුම්වලට ප්‍රධාන හේතු ඉස්මතු වන්නේ අසංතෘප්ත මානව අවශ්‍යතාවලින් මෙන්ම කොන් කරන ලද කණ්ඩායම් තුළ ඇතිවන බලවත් නොසතුට ට හේතු වන්නා වූ අසමාන සහ පීඩාකාරී සමාජ සහ දේශපාලන ව්‍යූහයන් තුළිනි. ඒ අනුව බලගැන්වීම පළමුවෙන්ම ආමන්ත්‍රණය කළ යුත්තේ අසමානවූ බල සම්බන්ධකම් පිළිබඳවයි. එහිදී ඉලක්කගත පරමාර්ථය විය යුත්තේ වඩා ප්‍රබල වූ සමාජ යුක්තියක් ලබාගැනීම සඳහා ඒවා සමතුලිත තත්ත්වයකට ගෙන ඒමයි.

බරාච් බුෂ් සහ ෆොල්ගර් (1994) ව්‍යාවර්තනික වූ ගැටුම්වලට මැදිහත්වීමේ කතිකාව ඇතුළත බලගැන්වීම නිර්වචනය කරනු ලබන්නේ මේ ආකාරයෙනිඃ

> *කිසියම් පාර්ශවයක් බලගන්වනු ලබන්නේ නව සංජානනයක් සහ අවබෝධයක් ලබාගැනීමෙනි. ඒවා නම්, (1) එහි අරමුණු (පාදක ඇගැයීම්, සම්මත බිය) (2) එහි විකල්ප (3) එහි නිපුණතා (4) එහි සම්පත් සහ (5) එහි තීරණ ගැනීම සහ මැදිහත්වීමේ දී හා සාකච්ඡා කිරීමේ දී මෙම නව ප්‍රතිවේද උපයෝගී කරගැනීමට හැකි වීම නිසාය.*



පළමුවෙන්ම බලගැන්වීම යනු වැඩි දියුණු කරන ලද ක්‍රියාවක් සඳහා අනුබල ලද ස්වයං ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියකි. වර්තමාන මැදිහත්වීම් සන්දර්භයට පමණක් මෙය සීමා නොවේ. එහෙත් අනාගත සාකච්ඡා සහ ගැටුම් බේරුම් කිරීමේ කාර්යයන්හි ඵලදායී අන්දමින් සම්බන්ධවීමට ද පාර්ශ්වයට ඉඩකඩ ලැබේ. ව්‍යාවර්තනික මැදිහත්වීමේ දී බලගැන්වීම සඳහා අනුපූරක සංරචකය වන්නේ පිළිගැනීමයි. මැදිහත්වීම් විරහිත ගැටුම්වල දී පාර්ශ්වයන් බොහෝ විට මූලික වශයෙන් යොමුවන්නේ ආත්මාරක්ෂාව වෙතයි. ඒ හේතුවෙන් ආරක්ෂාකාරී ආකල්පයකින් පසුවෙති. ඒ අනුව ඔවුන්ට තමන්ගේම වාසිය ගැන සිතීමෙන් ඔබ්බට යාමට බොහෝ විට නොහැකි වේ. මැදිහත්වීමේ කාර්යයේ දී පාර්ශ්වයන් පිළිගැනීමට ලක්වන්නේ ඔවුන් අනිකාගේ තත්ත්වය පිළිගැනීමට ලක්වන පරිදි සිය දෘෂ්ටි පථය පුළුල් කර ගැනීමට ක්‍රියා කිරීමෙනි.

බලගැන්වීම සහ පිළිගැනීම අතර, තිබෙන්නා වූ අන්‍යෝන්‍ය සම්බන්ධතාව ගැන අවධාරණය කිරීමෙන් තේරුම් යන්නේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය පවසන දේ ගැන සංවාද සහ ක්‍රියාකාරී සවන්දීමේ ක්‍රියාවලියක් ගැනයි. ප්‍රතිවිරුද්ධ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා, අවශ්‍යතා, භීතීන් සහ ඇගැයීම් පිළිගැනීම ක්‍රියාවලියකි. එයින් මෙය එම අවස්ථාවේ දී ම පිළිගැනීම මාර්ගයෙන් බලගැන්වීම කරා යන තමන්ගේම අපේක්ෂා, අවශ්‍යතා සහ ඇගැයීම් පැහැදිලි කර ගැනීමට උපකාරී වෙයි. අනෙක් කාරණය නම් පිළිගැනීම හේතු කොට ගෙන වටිනාකමක් ලබා දුන් බවට සාමාන්‍ය හැඟීමක් ඇතිවීමට එය දායක වෙයි. මෙය බොහෝ විට තහවුරු කළ හැකි සමගි සම්මුතියක් සඳහා වන පළමු පියවර වන්නේය. සංවර්ධනයට නැඹුරු වූ බලගැන්වීමේ කතිකාව තුළ බොහෝවිට වාගේ ගිලිහී ගොස් ඇත්තේ ඒකාන්තයෙන් මෙම අංශයයි.

*සංවර්ධනයට නැඹුරු* කතිකාව එහි බලගැන්වීම් ප්‍රවේශයන් සඳහා උපකල්පනය කරන්නේ දුප්පත්කමට ප්‍රධාන හේතුව වඩා බලවත් අය විසින් අතිශයින් දුප්පත් අය පීඩනයට පත් කිරීම හෝ සූරාකෑම බවයි. මෙයින් හැඟෙන්නේ සමාජයේ කිසියම් සංවර්ධනයක් නොමැතිවීම ගැන ලබාදෙන විග්‍රහයේදී බල සම්බන්ධතා වැදගත් කොටසක් විය යුතු බවයි. බලගැන්වීම යන පාඨය ඇත්ත වශයෙන්ම ආරම්භ වන්නේ 1960 ගණන්වල සහ 1970 ගණන්වල තිබූ සමාජ ව්‍යාපාරවලිනි. උදාහරණයක් වශයෙන් ඒවා නම් එක්සත් ජනපදයේ කළුබල ව්‍යාපාරය සහ පාවුලෝ ෆෙරෙයිරේගේ (1972) කෘති/ ක්‍රියාවල බලපෑම හේතු කොට ගෙන ඇති වූ ලතින් ඇමරිකාවේ විමුක්ති ව්‍යාපාරයයි.

1985 දී නයිරෝබියේ දී පැවැති කාන්තාවන් සඳහා වන තුන්වන ලෝක සම්මේලනයේ දී ඩෝන් (හිමිදිර) නැමැති කාන්තා ජාලය සංවර්ධනය සහ කාන්තාවන්ගේ දේශපාලනය පිළිබඳ කතිකාවට මෙම පාඨය හඳුන්වා දුන්නේය (සෙන් සහ ග්‍රවුන් 1988). ඩෝන් නම් කාන්තා ජාලයේ බලගැන්වීම නිර්වචනය කිරීමේ දී, පවතින සංවර්ධන රටාව ඇතුළත් බලය හා සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පරීක්ෂා කර බලයි. තවද පුද්ගලයන් සහ කණ්ඩායම් වෙනස් කොට සැලකීම සහ පීඩනයට පත් කිරීම පදනම් කරගත් පාලනය සහ බලය බලහත්කාරයෙන් ඉවත් කරන්නා වූ, ලිංග, වර්ග, පන්ති සහ ජාතීන් අතර පවතින බල සම්බන්ධතා විවේචනයට ලක් කරයි. බලගැන්වීම තේරුම්ගනු ලබන්නේ දෘෂ්ටියක් සහ හුදු පෞද්ගලික ක්‍රියාවලියක් වශයෙනි. එපමණක් නොව එය වඩාත් යුක්ති සහගත සහ සම්බන්ධතාවලින් යුත් සමාජයක් වෙත ව්‍යාවර්තනය කිරීමකි. බලගැන්වීමේ ක්‍රියාවලිය ස්ථාවර තත්ත්වයකට පත්වන විට පීඩිත ජනතාව සමාජය වෙනස් කිරීම සඳහා ඔවුන්ගේම බලය වර්ධනය කර ගනී. සමස්ත සමාජ ව්‍යාවර්තනය වෙත කැඳවාගෙන යනු ලබන්නේ මෙම දැනුවත්කම ගොඩනැගීමේ තනි ක්‍රියාවලියයි. ඒ සමගම සමස්තයක් වශයෙන් පීඩිත කණ්ඩායම් සාමූහික ක්‍රියාවලියක් වශයෙන් ගොඩනැංවීම එයට සම්බන්ධ වෙයි.



මෙම බලගැන්වීම පිළිබඳ නිර්වචනය තුළ විප්ලවයක් සඳහා විශේෂ හැකියාවක් තිබෙන බව පැහැදිලිය. එසේ වන්නේ එය පවතින බල ව්‍යූහයන් පිළිගැනීම ප්‍රතික්ෂේප කරමින් සැලකිය යුතු වෙනසක් ඉල්ලා සිටීමයි. රාජ්‍ය නොවන සංවිධාන, සංවර්ධන කාර්යයේ දී බලගැන්වීම් ක්‍රියාවලි මේ ආකාරයෙන් තේරුම් ගැනීම තුළින් ක්‍රියාකිරීම ස්වාභාවික තත්ත්වයකි. ඔවුන්ගේ වැඩකටයුතු මූලික වශයෙන්ම යොමුවන්නේ ගොදුරු බවට ලක් විය හැකි කණ්ඩායම් තුළ දැනුවත්කම වැඩි කිරීම සඳහාය. පීඩිත කොටස්වල අයිතීන් වෙනුවෙන් පැවැත්වෙන මහජන පෙළපාලි සහ උද්ඝෝෂණ කෙරෙහි ද අවධානය යොමු වේ. අද, බලගැන්වීම යන යෙදුම සංවර්ධන කතිකාව ඇතුළත ජනප්‍රිය විලාසිතාවක් බවට පත්වී නමුදු එය දැන් බොහෝ ද්විපාර්ශික සහ බහු පාර්ශ්වික ආධාර නියෝජිතායතන කරනු ලබන ආටෝප භාෂණවල අවශ්‍ය අංගයක් බවට පත් වී තිබේ. එහි විප්ලවීය හරය බොහෝ සෙයින් වියැකී ගොස් ඇති අතර, එය පාවිච්චි කරනු ලබන්නේ හුදෙක්ම මෙවලමක ස්වරූපයෙනි; එනම්, ව්‍යාපෘති බලපෑම්වල තිරසරභාවය වැඩිදියුණු කිරීමට සහ ව්‍යාපෘති පිරිවැය අඩුකර ගැනීමටය.

කෙසේ වුවද සමස්තයක් වශයෙන් බලගැන්වීම යන යෙදුම අපැහැදිලි තත්ත්වයක පවතී. තවමත් ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ සංවර්ධන ආධාර ලබාදීම පිළිබඳ කාරණය සම්බන්ධයෙන් ගත් කල

බලගැන්වීම් ප්‍රවේශය ඇත්ත වශයෙන්ම ක්‍රියාවට නංවන විවිධ ආකාර සහ ප්‍රමාණයි. බැලූ බැල්මට පෙනී යන අන්දමට බලගැන්වීම බොහෝ විට තේරුම් ගෙන ඇත්තේ කොන් වී ඇති කණ්ඩායම් ධාරිතා ගොඩනැංවීමේ කිසියම් ආකාරයක ක්‍රියාවලියකට මඳක් වැඩි දෙයක් ලෙසය. ඒ වෙනුවට අප පෙන්වා දෙන්නේ එක් අතකින් බලගැන්වීමත්, අනික් අතින් ධාරිතා වර්ධනය ගොඩනැංවීමත් පැහැදිලිව හඳුනා ගැනීමේ අවශ්‍යතාවයි.

අපගේ නිර්වචනය යටතේ ධාරිතා වර්ධනය ගොඩනැංවීම යනුවෙන් සඳහන් කරනු ලබන්නේ සමහර ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා හැකියාව ලබාදීමේ අදහසින් පුද්ගලයන් හෝ කණ්ඩායම්වලට දැනුම ආරෝපණය කිරීමයි. සංජානනය ඉහළ නැංවීම, පුහුණු කිරීම සහ වෙනත් මානව සම්පත් වර්ධන විධි මෙයට ඇතුළත් වේ. ධාරිතා වර්ධනය බලගැන්වීම සඳහා අවශ්‍ය නමුත් ප්‍රමාණවත් තත්ත්වයක් නොවේ. ස්ථානීය සමාජ ක්‍රමය සම්බන්ධයෙන් ගත් කල නිරන්තරයෙන්ම ඇති වන්නා වූ බලගැන්වීම හඟවන්නේ සාපේක්ෂ බලය සහ තමන්ට විශේෂී වූ සමාජ දේශපාලන පරිසරය තුළ වරප්‍රදසාද නොලත් කණ්ඩායම්වල හැකියාවයි. ඒ හේතු කොට ගෙන බලගැන්වීම් සම්බන්ධයෙන් වූ ක්‍රමෝපායයන් මගින් බලගැන්විය යුතු පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල මෙන්ම පාලන ව්‍යූහය සහ ආයතනික සැකසුම් කෙරෙහි ආධිපත්‍යය පවත්වාගෙන යන සහ තීරණ ගන්නා විශාල කණ්ඩායම්වල අවශ්‍යතා ගැන සැලකිල්ල යොමු කළ යුතු වේ. ගොදුරුවීමට ලක්විය හැකි වරප්‍රසාද නොලත් කණ්ඩායම් සාර්ථක අයුරින් බලගැන්වීම ඒ අනුව වරප්‍රසාද නොලත් අයගේ ධාරිතා වර්ධනය ගොඩනැගීම සහ පීඩාකාරී රීති සහ ක්‍රියාමාර්ග සංශෝධනය යන කරුණු දෙකෙහිම ස්වභාවික ප්‍රතිඵලයක් වනු ඇත.



මැදිහත්වීමේදී සහ විකල්ප ආරවුල් නිරාකරණය කිරීමේදී නිතර භාවිත වන සංකල්ප පිළිගැනීම ප්‍රජා සංවර්ධනයේ දී බලගැන්වීම් ක්‍රමෝපායන්වල සාර්ථකත්වය සඳහා ද අවශ්‍ය වේ. ප්‍රජාභ්‍යන්තර සහ ප්‍රජාවන් අතර සම්පත් ප්‍රතිපාදනය සහ ආරවුල් නිරාකරණය නිතරම කාරණයටම විසඳීමක් ලබා දෙනවාට වඩා දුරදිග යන දෙයකි. මෙහි දී අදාළ සියලු පාර්ශවයන් සියලු සුදුසුකම්වලින් සමන්විත සාකච්ඡාවේ කොටස්කරුවන් වශයෙන් පිළිගැනීමට ලක් විය යුතු වේ. මෙහිදී බොහෝ විට මධ්‍යස්ථ සහ පළපුරුද්දෙන් යුත් පුද්ගලයෙකුගේ සේවය ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා ලබාගැනීමට සිදු වේ. සංවර්ධන කතිකාව තවදුරටත් අවධාරණය කර ඇත්තේ බලගැන්වීම සැමවිටම විශාල වූ සහ වඩා සංකීර්ණ වූ සමාජයීය ක්‍රමයක ගැබ් වී තිබෙන ක්‍රියාවලියක් බවයි. එබැවින් ඒ අවස්ථාවේදීම යෝග්‍ය වූ ආයතනික සැකසුම් සහ පාලන ව්‍යූහය දිරිගැන්වීමක් නොකර පුද්ගලයන් සහ කණ්ඩායම් ශක්තිමත් කිරීම ප්‍රමාණවත් නොවේ.

ඊළඟ කොටසේ අපි වර්තමානයේ සංවර්ධන සහයෝගතා කාර්යය සඳහා උපයෝගී කරගන්නා සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශ සමහරක් ඇගැයීමට ලක් කරමු. විශේෂයෙන්ම එය ඌන සංවර්ධිත රටවල වරප්‍රසාද නොලත් කණ්ඩායම් බලගැන්වීම සඳහා ඔවුන්ගේ ඇති හැකියාව පිළිබඳ ව වන්නේය. 6 වන කොටස ඊට පසු සාකච්ඡා කරනු ලබන්නේ ක්‍රියාත්මක කිරීමයි. එහිදී අර්ථාන්විත ගැටුම් ව්‍යාවර්තනයකට දායකවීම සඳහා වූ ඕනෑම ප්‍රයත්නයකට සම්බන්ධ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයන්ගේ හැකියාවන් සහ බාධක පරීක්ෂා කර බලනවා ඇත.

# 5. ප්‍රජා සංවර්ධන සන්දර්භය ඇතුළත සහභාගීවීමේ සහ බලගැන්වීමේ ප්‍රවේශ

සහභාගීවීම සහ බලගැන්වීම යන පාඨ දැන් සංවර්ධන සහයෝගතා ප්‍රධාන ප්‍රවාහයේ පොදු පිළිගැනීමක් ලබා ඇත. සැබැවින්ම සියලුම ප්‍රධාන පෙළේ ද්විපාර්ශ්වික සහ බහු පාර්ශ්වික සංවර්ධන නියෝජිතායතන මෙම ආටෝපවත් යෙදුම පිළිගෙන ඇත. අනතුරු වන්නේ, ඇත්ත වශයෙන්ම සහභාගීවීම යන යෙදුම දැන් උද්යෝග පාඨයක් හෝ ලාංඡනයක් තත්ත්වයට පහත වැටීමයි. මේවා ප්‍රයෝජනයට ගනු ලබන්නේ ආධාර අරමුදල් ආකර්ෂණය කර ගැනීමට දායක වීම සඳහා පමණි. අපි එබැවින් පරීක්ෂාකාරීව මෙම පාඨ නිර්වචනය කළ යුතු වෙමු. එහි දී විශේෂයෙන්ම බැලිය යුත්තේ ප්‍රජා සංවර්ධන සන්දර්භය තුළ ඒවා කෙතරම් හොඳින් පාවිච්චි කර ඇත් ද යන්නයි.

සහභාගිකත්වය ප්‍රවේශ න්‍යායයට පක්ෂ එක් ප්‍රධාන පෙළේ උගතෙකු වූ රොබට් චෙම්බර්ස් (1995) 30 පිටුව සංවර්ධන සහයෝගතාව සම්බන්ධයෙන් සහභාගීවීම ප්‍රයෝජනයට ගත හැකි මාර්ග තුනක් හඳුනාගෙන ඇත:

- ප්‍රධාන වශයෙන් ආධාර දෙන නියෝජිතායතනය සතුටු කිරීම සඳහා, ඇත්ත වශයෙන්ම ඕනෑම යෝජනාවක් ආටෝප කිරීම සඳහා ආලේපන ලාංඡනයක් වශයෙන්,
- ශ්‍රම බලකාය උනන්දු කරවීම සඳහා සහ පිරිවැය අඩු කිරීම සඳහා අනුයුක්ත කර ගැනීමේ ක්‍රියාවක් ලෙස. ප්‍රජා කොටස් 'අපගේ' ව්‍යාපෘති තුළ 'ඔවුන්ගේ' ශ්‍රමය යොදති.
- ස්ථානීය ජනතාවට තමන්ගේ තත්ත්වය විශ්ලේෂණය කරගැනීම, විශ්වාසය දිනාගැනීම සහ තීරණ ගැනීම සඳහා උපකාරීවන බලගැන්වීමේ ක්‍රියාවලියක් විස්තර කිරීම.



වෙනස් වූ ගුරු කුල දෙකක් අතර, තිබෙන්නා වූ වෙනස අපි හඳුනා ගනිමු. සමහරු සහභාගීවීම දකින්නේ ප්‍රධාන වශයෙන් ව්‍යාපෘතියේ තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා වන උපක්‍රමයක් හෝ මෙවලමක් ලෙසිනි. බලාපොරොත්තුව වන්නේ තමන්ගේම සංවර්ධන ක්‍රියාකාරකම්වලට සම්බන්ධවීමට ඉලක්කගත කණ්ඩායම් දිරිමත් කිරීමෙන් හා ව්‍යාපෘති පිරිවැයට ඔවුන්ගේ ඍජු දායකත්වයෙන් ජනතාව අයිතිය බාරගෙන ඇත. ඒ අනුව ඔවුන්ම සංවර්ධන ක්‍රියාවලිය පෝෂණය කරමින් නිර්මාණය කරන ලද කිසියම් වත්කමක් වේ නම් එය පවත්වා ගන්නවා ඇත යනුයි. අනෙක් අය තර්ක කරන්නේ සහභාගීවීම නියත අවසානයක් විය යුතු බවයි: සහභාගීවීමේ ක්‍රියාවලි ස්ථානීය තලයේ තීරණ ගැනීමේ බලය වැඩිවීම කරා යා යුතු බව ද කියැවේ. මෙහිදී සහභාගීත්ව ප්‍රවේශයන්ගේ ප්‍රධානතම පරමාර්ථය බවට පත්වන්නේ භෞතිකමය ව්‍යාපෘති ප්‍රතිඵල නොව බලගැන්වීමයි.

කැරොලයින් මෝසර් (1993) ද මෙම වෙනස දිසාවට ඇඟිල්ල දිගු කරයි. එනම් කාර්යක්ෂමතාව වැඩි කරගැනීමේ උපක්‍රමයක් වශයෙන් සහභාගීවීම හා පිරිවැය බෙදාගැනීම සහ බලගැන්වීම අවසාන පරමාර්ථය කර ගෙන සහභාගීවම මේ කරුණු දෙක අතර ඇති වෙනසයි.

සහභාගීවීම උපක්‍රමීය ක්‍රියාවක් වන අවස්ථාවේදී. එය සාමාන්‍යයෙන් කාර්යයන් කරවා ගැනීම සඳහා වන එක්තරා සජීවිකරණයක් බවට පත්වන්නේය. මෙය විශේෂිත පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඒ හා සමාන වූ රාජ්‍ය මෙහෙයවීමක් හෝ සමහරවිට බලකිරීමක් මත කෙරෙන

අනුක්‍රමික සජීවීකරණයක් විය හැකිය. නැතහොත් සම්පත්වල වැඩි කොටසක් ලබාගැනීම සඳහා වූ උඩු අත් 'ස්වේච්ඡා' ප්‍රජා මූල සජ්ජිත වීමක් විය හැකිය. සහභාගීවීම ක්‍රියාවලියේ අවසානය හැටියට හඳුනාගත් විට දී, පරමාර්ථය ස්ථාපිත හෝ ප්‍රමාණ කරන ලද සංවර්ධන ඉලක්කයක් නොවන්නේය. එහෙත් එය ක්‍රියාවලියකි. එහි ප්‍රතිඵලය සංවර්ධන ක්‍රියාවලියට 'අර්ථවත්' අයුරින් සහභාගීවීමය.

තීරණාත්මක ප්‍රශ්නය වන්නේ ප්‍රවේශය ක්‍රියාවට නංවන්නේ කෙසේද යන්නයි. සහභාගී වන්නේ කවුද? කුමක ක්‍රියාකාරකම්වලද? නැතිනම් කුමන ආකාරයෙන්ද? එසේ කරන්නේ ඇයි? සහභාගීවීමේ තීව්‍රතාවයේ විවිධ තලයන් ශ්‍රේණිගත කිරීම සඳහා වූ පහත සඳහන් වර්ග අධ්‍යයනයේ දී සඳහන් කර ඇති පරිදි එවැනි සහභාගීවීමක විවිධ ස්වරූප හඳුනා ගැනීමට ඉඩකඩ තිබේ:

- (සහන) ආධාර ලබන අය වශයෙන් අක්‍රිය සහභාගීත්වය;
- තොරතුරු දීමේ මාර්ගයෙන් (උදාහරණයක් වශයෙන් සමීක්ෂණවලදී) යමක් ලබාගැනීම සඳහා සහභාගීවීම;
- සාකච්ඡා තුළින් සහභාගීවීම (දැනට ක්‍රියාත්මක වන හෝ සැලසුම්කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ලබාගැනීමෙන් පසු);
- භෞතික පෙළඹීම් නිසා සහභාගීවීම (අනුබලය වෙනුවට සම්පත් සපයාදීම);
- ප්‍රායෝගිකව සහභාගීවීම (කලින් තීරණය කරන ලද පරමාර්ථවලට ගැලපෙන පරිදි කණ්ඩායම් සංවිධානය කිරීම);
- අන්තර්-ක්‍රියාකාරීත්ව සහභාගීවීම (සාමුහික ක්‍රියා සඳහා බාහිර සහයෝගය ඇතිව ඒකාබද්ධ විශ්ලේෂණය)
- ස්වයං-සජ්ජිතවීම (බාහිර ආයතනවලින් නිදහස්ව ආරම්භක පියවර ගනු ලැබේ)



ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති බොහෝ විට බලගැන්වීම ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ මනාව තුලනය වූ ආයෝජන සහ ක්‍රියාවලි සංකලනයකිනි. එක් අතකින් ව්‍යාපෘතිය මගින් ස්ථානීය සාමුහික ක්‍රියාකාරීත්වය සඳහා දිරිගැන්වීම්, භෞතික සම්පත් සහ අරමුදල් සපයනු ලැබේ. අනික් අතට ස්ථානීය ආයතන සහ සංවිධාන ශක්තිමත් කරනු ලබන්නේ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය ගොඩනැංවීම තුළිනි. ප්‍රායෝගික වශයෙන් ප්‍රජා සංවර්ධනයේ දී බලගැන්වීම වැඩි වශයෙන් අරමුණු කරගනු ලබන්නේ ආධාර ආයතන මගින් අරමුදල් ලබාදී ඇති ග්‍රාමීය ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ඉලක්කගත කණ්ඩායම්වල ක්‍රියාකාරී සහභාගීත්වය ලබාගැනීමය.

ඒකාබද්ධ සැලසුම් කිරීම් සහ තීරණ ගැනීම් මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ස්වදේශික කළමනාකරණයට පහසුකම් සැලසීමත් බලාපොරොත්තු වන්නේ සමාජ ඉගෙනුම් ක්‍රියාවලියක් සඳහා උනන්දු කරවීමටය. මෙම ප්‍රයත්නයේ දී සමාජ සංවර්ධනය විවිධාකාර වූ මෙවලම් ප්‍රයෝජනයට ගනී. විශේෂයෙන් උනන්දුවන විෂයයන් දෙකක් අප හමුවේ ඇත. එනම් සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයීම් (කොටුව 2 බලන්න) සහ සමාජ සජීවීකරණයයි. මේ දෙකම දකුණු ආසියානු සංදර්භය තුළ පොදුවේ ව්‍යාප්ත කරනු ලැබේ. ඒවා අර්ධ වශයෙන් අනුපූරක බවක් පෙන්නුම් කරන අතර, අර්ධ වශයෙන් එකිනෙකට සතුරු බවක්ද පෙන්නුම් කරයි.

සමාජ සජ්ජීතකරණ ප්‍රවේශය වෙනුවෙන් කතා කරන අය බොහෝ විට සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයීම් ප්‍රවේශය ගැන ප්‍රශ්න මතු කරති. ඔවුන්ගේ ප්‍රශ්න පදනම් කරගනු ලබන්නේ එය දීර්ඝකාලීන ක්‍රියාවලිවලට වඩා කාර්යයෙහි යොදවන භාණ්ඩ/ පුද්ගලයන් කෙරෙහි අවධානය යොමු කරන සමාජ ඉංජිනේරු කාර්යයක් බවයි ඔවුන් යෝජනා කරන්නේ වරප්‍රසාද නොලත් කණ්ඩායම් සත්‍ය වශයෙන්ම බලගැන්වීම සඳහා දීර්ඝකාලීන ප්‍රවේශයක් අවශ්‍ය බවයි. එය ගමක පවත්වන සතියක වැඩමුළුවකට වඩා ඔබ්බට යන එකකි. සහභාගීත්ව ග්‍රාමීය ඇගැයුම ගැන හදාරා ඇති අය අනික් අතට අවධාරණය කරන්නේ එම අගැයුමට සම්බන්ධ ගම් මට්ටමේ වැඩමුළුවක් සැලකිය හැක්කේ නිරතවීමක් සඳහා වූ දීර්ඝ කාලීන ක්‍රියාවලියක එක් කුඩා පියවරක් බවයි. මෙම ත්‍රියාවලියට සාකච්ඡා, කේවල් කිරීම්, සංවාද සහ ගැටුම් නිරාකරණය සම්බන්ධ වෙයි (ෂා සහ ෂා 1995) එය අවශ්‍ය වුවත් ගොදුරු බවට ලක්විය හැකි කණ්ඩායම් බලගැන්වීම සඳහා ප්‍රමාණවත් මෙවලමක් නොවේ.

### කොටුව 02 සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම (ස. ග්‍රා. ඇ)

සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම (ස ග්‍රා ඇ) යන යෙදුම පොදුවේ ගත් කල සඳහන් කරන්නේ ප්‍රවේශයන්, විධි සහ චර්යාවන්වලින් යුත් කුලකයකි. එය හේතු කොට ගෙන ජනතාවට ලැබෙන හැකියාව වන්නේ තම ජීවිතවල සහ ස්වභාවයන්ගේ යථාර්ථයන් ප්‍රකාශයට පත් කිරීම හා විශ්ලේෂණය කිරීම කුමන ක්‍රියාමාර්ගයක් ගත යුතු දැයි සැලසුම් කිරීම සහ ප්‍රතිඵල අධීක්ෂණය කිරීම සහ ඇගැයීම ආදියයි. යෙදුම ව්‍යාකූල වේ. එය පර්යාය පදයන් කිහිපයක්ම යටතේ භාවිත කරනු ලැබේ. ඒවා නම් සහභාගිකත්ව ඉගෙනීම සහ ක්‍රියාව, (PLA) සහභාගිකත්ව අවශ්‍යතා තක්සේරුව (PNA) ආදියයි. සහභාගීකත්ව ග්‍රාමීය ඇගැයුමේ ප්‍රධාන මූලයන් වන්නේ භාවිතයට ගනු ලබන විධි සහ ඒවාට පහසුකම් සලසන අයගේ හැසිරීම් සහ ආකල්පයි.

**විධි:**

මහජනතාවට අදහස් ප්‍රකාශ කිරීමට සහ තොරතුරු හුවමාරු කර ගැනීමට සහ සාකච්ඡා සහ විශ්ලේෂණ කෙරෙහි උනන්දුවක් ඇති කිරීම පහසුවීම සඳහා සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම විධි යොදාගනී. දෘශ්‍ය ක්‍රමවේදය නිර්මාණ කුසලතා වර්ධනය කරයි තොරතුරුවල හරි වැරදි බලයි. අදහස් හුවමාරු කර ගැනීමට ධෛර්ය සපයයි. සහභාගිකත්ව ග්‍රාමීය ඇගයුම් මෙවලම් එකතුවක් පාවිච්චිය හේතු කොට ගෙන ගැමි ජීවිතයේ සංකීර්ණත්වය සහ විවිධත්වය පිළිබඳව වඩාත් පැහැදිලි චිත්‍රයක් නිර්මාණය කිරීමට හැකි වෙයි. පොදු මෙවලම් වන්නේ:

- අනුරූපකරණය (සිතියම්කරණය)
- ගැලීම් රේඛා සටහන්

- වාර්ෂික කැලැන්ඩර (කාල දින දර්ශන)
- අච්චු සහ රාමු (න්‍යාය සහ ජාලක සටහන්)
- ගම හරහා සක්මන (ග්‍රාම සමීක්ෂාව)

මෙම මෙවලම් උපයෝගී කරගනු ලබන්නේ කණ්ඩායම් සාකච්ඡාවලදී සහ අර්ධ වශයෙන් සංවිධානය කරන ලද හමුවීම්වලදීය.

**පහසුකම් සැලසීම :**

පහසුකම් සලසන අය ස්ථානීය ජනතාවට ආධාර කරනු ලබන්නේ ඔවුන්ගේ විශ්ලේෂණයන් කරගැනීමට උදව් කිරීමෙන්ද විමර්ෂණය කිරීමෙන් හා අවසාන වශයෙන් ඔවුන් විසින්ම සැලසුම් කිරීමෙන්ය. තොරතුරු ගම්වාසීන් සහ බාහිර අයවලුන් (සැලසුම්කරුවන් හා ක්ෂේත්‍රයේ අය) අතර මෙන්ම ගම්වාසීහු ඔවුන් අතරමත් බෙදාගනිති. සහභාගිකත්ව ග්‍රාමීය ඇගයුම් බොහෝ විට ක්‍රියාත්මක කරනු ලබන්නේ ගැමි වැඩමුළුවල ස්වරූපයෙනි. ඒකාබද්ධ වී ඇගයුමක් සලසන අය ටික දිනකට ගැමියන් සහ එක් වෙති.

**හැසිරීම් සහ ආකල්ප**



ආකල්පවල වෙනස්වීම් සහ බාහිර පහසුකම් සපයන්නන්ගේ සහ ව්‍යාපෘති සැලසුම් කරන අයගේ භූමිකා විධිවලටත් වඩා අතිශයින් වැදගත් වේ. බාහිර අයගෙන් අභ්‍යන්තර අයට 'යෂ්ටිය භාරදීමක්' ගැන චේම්බර්ස් කතා කරයි. එනම්, ගම්වාසීන්ටමය. සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුමේ පහසුකම් සපයන අය කැඳවුම්කරුවන් සහ උත්ප්‍රේරකයන් හැටියට ක්‍රියා කළ යුතුය. එනමුත් ක්‍රියාවලිය තමන්ගේ ආධිපත්‍යය යටතට නොගත යුතුය. ඔවුන් ගෞරවයක් දක්විය යුතුය. කාලය ගත යුතුය. විවෘත හා ස්වයං විවේචනාත්මක විය යුතුය. ස්ථානීය ජනතාවට ඔවුන්ගේ විශ්ලේෂණය කරගෙන යාමට හැකියාව තිබෙන බව විශ්වාසය ගොඩනගා ගැනීම අවශ්‍ය වේ (sources: Institute for Development Studies 1995; Chambers 1994 a, 1995; Chambers & Guijt 1995) .

සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම ඉතා හොඳින් අවබෝධ කරගත හැක්කේ 'සංවර්ධන සැලසුම් දර්ශනවාදයක්' ලෙසයි. නැතහොත් 'ප්‍රවේශ කුලකයක්' ලෙසිනි. ඒවා ජනතාවට අවස්ථාවක් ලබා දෙන්නේ ඔවුන්ගේ ජීවිත හා තත්ත්වයන්හි යථාර්ථය ප්‍රකාශ කිරීමට හා විශ්ලේෂණය කිරීමටත් ගත යුතු ක්‍රියාමාර්ගය තමන් විසින්ම සැලසුම් කිරීමටත්, එමෙන්ම ඊට පසු ප්‍රතිඵල අධීක්ෂණය කොට ඇගැයීමටත්ය. සාමාන්‍යයෙන් කිසියම් තෝරාගත් ප්‍රදේශයක සංවර්ධන ප්‍රශ්න සහ මූලික අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඊට පසුව සිදුවන ව්‍යාපෘති සැලසුම් කිරීම ආරම්භ වන්නේ විශේෂිත ස්ථානයක පවත්වන වැඩමුළුවකිනි. එම අභ්‍යාසයේ දී සාමාජිකයින් කීප දෙනෙකුගෙන් හා එක් මැදිහත් මෙහෙයවන්නෙකුගෙන් සමන්විත සහභාගිකත්ව ග්‍රාමීය ඇගයුම් කණ්ඩායම ඒකාබද්ධ විශ්ලේෂණය සහ ඉගෙනුම් ක්‍රියාවලියක් සඳහා පහසුකම් සලසනවා ඇත. එහි දී විවිධ මෙවලම් වන ගැලීම් රේඛා සටහන් සහ ගම හරහා සක්මන්

උපයෝගී කරගන්නවා ඇත. එසේ කරනු ලබන්නේ ගැමි ජීවිතයේ සංකීර්ණත්වය සහ විවිධත්වය පිළිබඳ පරිපූර්ණ චිත්‍රයක් නිර්මාණය කරගනු සඳහාය.

ස්ථානීය ජනතාව සෑමවිටම එවැනි ක්‍රියාවලියක අයිතිය ලබාගත යුතු වන්නේ ඔවුන් තමන්ගේම යථාර්ථය විශ්ලේෂණය කරන නිසාත්, එමෙන් ම ප්‍රමුඛතා අනුව තමන්ගේ ම ව්‍යාපෘති සැලසුම් කරන නිසාත් ය. සෑම විටම අදාළ සමාජ කණ්ඩායම් (කාන්තා, තරුණ, ගැමි, නායක ආදීන්) සම්බන්ධ කර ගැනීමට සෑම වෙහෙසක්ම දරනවා ඇත. කොන් කරන ලද හෝ නොසලකා හරින ලද අය මෙහිදී විශේෂ වෙති. සහභාගිකත්ව ග්‍රාමීය ඇගයුමේ ප්‍රතිඵලය ප්‍රමුඛත්වය දිය යුතු ව්‍යාපෘති ලැයිස්තුව සමග ඇති සවිස්තර සංවර්ධන සැලැස්ම පමණක් නොවේ; එහි ඒකාබද්ධ ඉගෙනුම් ක්‍රියාවලියක් ද අඩංගු වේ. මෙය හේතු කොට ගෙන ස්ථානීය ජනතාවට අපේක්ෂා සහගතව ග්‍රාමය / පරිසරය සංවර්ධනය කිරීමේ වගකීම භාර ගැනීමේ හැකියාව ලැබෙනු ඇත.

මේ ආකාරයෙන් තේරුම්ගත් විට සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම (PRA) ස්ථානීය තලයේදී බලගැන්වීමේ ක්‍රියාවලිය පණ ගැන්වීමට විශිෂ්ට අන්දමින් සුදුසු බව මැනවින් පැහැදිලි වේ. කෙසේ වුවද යථා තත්ත්වය අනුව එය බොහෝ විට ක්‍රියාත්මක කරනු ලබන්නේ සාමාන්‍යයෙන් යන්ත්‍රයක් ක්‍රියා කරන ආකාරයෙනි. එසේ වන්නේ සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම් මෙවලම් ගමේ දී පාවිච්චි කරනු ලබන්නේ තොරතුරු එක්රැස් කිරීම සඳහා වන හුදු ප්‍රයත්නයක් ලෙසට වීමය. එහිදී ගැමියන්ට ක්‍රියාකාරීව සහභාගීවීමට සහ පසු විපරම් සඳහා තීරණ ගැනීමේ බලය ලබා ඇති නමුත් කිසිම ආකාරයක ක්‍රියාවලියක් පණ ගැන්වීම පිළිබඳව ඉස්මතු කොට පෙන්වීමක් දක්නට නැත. නිරන්තරයෙන් ම බොහෝ විට පර්යේෂකයින් සහභාගිකත්ව ග්‍රාමීය ඇගයුම් මෙවලම් තාවකාලිකව ලබාගෙන ස්ථානීය තලයෙහි දත්ත සහ තොරතුරු එක්රැස් කර ගැනීමට පමණක් භාවිත කරති. ඔවුහු ප්‍රතිඵල වශයෙන් ලැබෙන කිසිම ප්‍රතිපෝෂණයක් ගැමි ජනතාවට ලබා නොදෙති. එබැවින් බොහෝ ග්‍රාමීය ප්‍රදේශවල සහභාගිත්ව ග්‍රාමීය ඇගැයුම් කාණ්ඩයක් ඔවුන්ගේ ගමට ඇතුළුවන බව දුටු විට ස්ථානීය ජනතාව ඔවුන් ගැන සැක පහළ කිරීම පුදුමයට කරුණක් නොවේ. තමන්ට පැහැදිලිව පෙනෙන කිසිම ප්‍රතිලාභයක් නොමැතිව මෙවලම් සමග වැඩ කරමින් තවදුරටත් කාලය ගත කිරීමට ඔවුන්ගේ කිසිදු කැමැත්තක් නැත (කෝර්ෆ් 2000).

මෙම යෙදුමට තිබූ තවත් අර්ථ වන්නේ ස්ථානීය සංවිධානය කිරීමේ හැකියාව, මානව සම්පත් සහ ප්‍රජා ආයතන ශක්තිමත් කිරීමයි. ඒ අනුසාරයෙන් සහභාගීත්ව සංවර්ධනය සඳහා මඟ පෙන්වමින් ගැටුම් නිසා පීඩාවට පත් ප්‍රජාවන්ගේ දරාගැනීමේ යාන්ත්‍රණ නැවත ශක්තිමත් කරනු ලැබේ (සචිතානානන්දන් 1996 පිටුව 867). රාජ්‍ය නොවන සංවිධානයකින් බඳවා ගන්නා ලද අයෙකු හෝ තෝරාගත් ගමේ නියෝජිතයෙකු හෝ විය හැකි සමාජ සජ්ජිත කරන්නෙකු, පහසුකම් සලසන්නෙකු (උත්ප්‍රේරකයෙකු) වශයෙන් සාමුහිකව ක්‍රියා කිරීම සඳහා කණ්ඩායම් සෑදීම දිරි ගන්වයි. දකුණු ආසියානු සන්දර්භයේ දී සමාජ සජ්ජිතකරණය බෙහෙවින් විලාසිතාවක් බවට පත්වී තිබේ. එය දැන් බහුල වශයෙන් රාජ්‍ය ආයතන, ද්විපාර්ශවික ආධාර සපයන නියෝජිතායතන මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන ද භාවිතයට ගනී. එය භාවිතයට ගන්නා විවිධ අය වෙනස් වූ ආකාරයෙන් තේරුම් ගෙන ඇත. එහෙත් බොහෝ විට එහි යොදාගැනීම ඇත්ත වශයෙන්ම නිර්දේශපාලනීය හා ප්‍රායෝගික වේ. කණ්ඩායම් සෑදීම සඳහා ජනතාව සජ්ජිත කරනු ලබන්නේ මූලික වශයෙන් දැනුවත්කම් නිර්මාණයට සහ ස්වයං සංවිධානයට වැඩි කාලයක් වැය නොකර ව්‍යාපෘති කාර්යක්ෂම අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා ය.

**කොටුව 3 සමාජ සජ්ජීත කිරීම**

සමාජ සජ්ජීතකරණය යනු පහසුවෙන් ගොදුරු විය හැකි කණ්ඩායම් (එනම් අන්ත දුප්පත් අය, කාන්තාවන්, තරුණයින්, කුලහීනයන්, වාර්ගික කණ්ඩායම් යුද්ධයෙන් පීඩාවට පත් අය, සරණාගතයින් සහ වෙනත් කොටස්) බලගැන්වීම වේ. එයට,

- සංජානනය නිර්මාණය කිරීම;
- ස්වයං සංවිධානය සහ
- ක්‍රියාකාරිත්වය

සංයෝග වේ. එසේ වන්නේ කොන් කරන ලද දුප්පත් ජනතාවගේ සමාජ සහ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහාය. ජනතාව කුඩා කණ්ඩායම් සාදාගනිති. ඔවුන්ට තමන්ගේ හැකියාව පිළිබඳව සහ ඔවුන්ට වෙන් කොට තිබෙන සම්පත් ගැන අවබෝධයක් ලබාදෙනු ලැබේ. එනම් පවතින රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික සේවා වේ.

ඒ අනුව සමාජ සජ්ජීතකරණයට ස්වරූප දෙකක් සම්බන්ධ වේ

- පහසුවෙන් ගොදුරු විය හැකි කණ්ඩායම්වල පුද්ගලික හා මනෝවිද්‍යාත්මක ස්වයං සංජානනය වෙනස් කිරීම.
- බැහැර කිරීම් සහ කොන් කිරීම් හා සම්බන්ධ සමස්ත තත්ත්වය හා බද්ධ වී ඇති සමාජ හා ආර්ථික තත්ත්වයන් වෙනස් කිරීම.

**සමාජ සජ්ජීතකරණය දීර්ඝ කාලීන ක්‍රියාවලියකිඃ**

දකුණේ බොහෝ රාජ්‍ය නොවන සංවිධාන තමන්ගේ ගමේ හෝ සම්භවයට සම්බන්ධ ප්‍රදේශයේ ජීවත් වෙමින් වැඩ කරන පුහුණු ගැමි ස්වේච්ඡා සේවකයින් (වෙනස්කම් ඇති කරන නියෝජිතයින් හෝ සමාජ සජීවීකාරකයින්) මෙහෙයේ යොදවා ගැනීම මගින් බලගැන්වීම ප්‍රවර්ධනය කරයි. අනිකුත් සංවිධානවලට ප්‍රජා තලයේ දී පහසුකම් සලස්වන්නන් හෝ සමාජ සජ්ජීතකාරකයින් වශයෙන් සේවය කරන පුහුණු කාර්ය මණ්ඩලයක් ඇත. මෙ ස්වේච්ඡා සේවකයින් හෙවත් සමාජ සජ්ජීතකරණය වැඩිදුර සංවර්ධනය සඳහා ප්‍රාථමික කුඩා කණ්ඩායමක් වශයෙන් ඉතිරි කිරීම් සහ ණය කණ්ඩායම් සෑදීමට දුප්පත් ගම් වැසියන් ධෛර්යමත් කරනු ලැබේ. සමාජ සජීවීකරණය යොමුවන්නේ කණ්ඩායම් පදනම් කරගත් ප්‍රවේශයකටය. කාලයත් සමග කුඩා කණ්ඩායම් විශාල කණ්ඩායම් බවට වර්ධනය වේ. ඒවාට වඩාත් විධිමත් ව්‍යුහයන් ද එක් වේ (ප්‍රජා මූලික කරගත් සංවිධාන) ඒ අනුව සාමූහික කියා සඳහා සහ සේවා සපයන්නන් (ආණ්ඩුවේ දෙපාර්තමේන්තු රාජ්‍ය නොවන සංවිධාන, පුද්ගලික ව්‍යාපාර) සමග කේවෙල් කිරීම සඳහා ස්ථානීය ස්වයං ආධාර හැකියාවන් ශක්තිමත් වේ.

**සමාජ සජ්ජීතකරණය ක්‍රියා කරන්නේ අවබෝධය වැඩි දියුණු කිරීම මගිනි:**

තමන් දුප්පත් වී ඇත්තේ ඇයිද සහ තම දුප්පත්කම වැඩි කරන තත්ත්වයන් මොනවාද යන කරුණු විශ්ලේෂණය කිරීමට හැකිවන පරිදි දුප්පත් අය එක්තරා තත්ත්වයකට ගෙන එනු ලැබේ. ඒට පසු තමන්ගේ ම ක්‍රියාමාර්ගවලින් දුප්පත්කම නැමැති උගුලෙන් ගැලවී යාමට හැකියාව ලබාගත හැකි සමහරවිට සාර්ථකවීමට ඉඩ ඇති විසඳුම් හඳුනා ගනු ලැබේ.

කල්ගත වන ගැටුම් පිළිබඳව ගැටුම් ව්‍යාවර්තනය කතිකාවේ සඳහන් වන්නේ සුළුතර කණ්ඩායම් සඳහා වන මානව හිමිකම් ප්‍රශ්නයේ දී සමාජ සජ්ජීතකරණය තවත් මානයක් ඉදිරිපත් කරන බවයි. කොන් කරන ලද කණ්ඩායම්වලට (එනම් වාර්ගික කණ්ඩායම්, කාන්තාවන්, කුලහීන කොටස්) තමන්ගේ අනන්‍යතාව හඳුනාගැනීමට සහ දියුණු කර ගැනීම සඳහා තම අයිතිවාසිකම් පිළිබඳ අවබෝධයක් ලබා දෙනු ලැබේ. ඒ නිසා ඔවුහු දේශපාලන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරීව සහභාගී වෙති.

සංවර්ධන ආධාර සන්දර්භය බොහෝ විට සහභාගීත්ව ග්‍රාමීය ඇගැයුම් සහ සමාජ සජ්ජීතකරණය යන ක්‍රියාවලි දෙකම භාවිතයට ගනියි. මෙහිදී සමාජ සජීවීකරණය තේරුම් ගනු ලබන්නේ සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ජනතාව සම්බන්ධ කරවා ගැනීමේ පොදු ව්‍යාපෘති ප්‍රවේශයක් ලෙසයි. එමෙන්ම විශ්ලේෂණය කිරීම සහ ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා සහභාගීත්වය ග්‍රාමීය ඇගැයුම් මෙවලම් පාවිච්චි කරමින් තමන්ගේ ග්‍රාමයේ සංවර්ධන ක්‍රියාවලියේ අයිතිය තෝරාගැනීමේ දී ද ඉහත සඳහන් උපකල්පනය බලපායි. සමාජ සජ්ජීතකරණය සාමාන්‍යයෙන් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට කණ්ඩායම් සාකච්ඡා සඳහා පහසුකම් සලසනු ලබන්නේ ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහාය. එහි දී සමහර ගොදුරු බවට ලක්විය හැකි කණ්ඩායම් ගැන අවධානය යොමුවෙයි. තවද තමන්ගේ රාජකාරී කටයුතු වඩාත් හොඳින් කරගෙන යාම සඳහා නායකත්වය සහ කළමනාකරණ නිපුණතා පිළිබඳව සමාජ සජ්ජීතකාරකයන් විසින් පුහුණු කිරීම සඳහා කණ්ඩායම් නායකයින් හඳුනාගනු ඇත.

තවමත් නියමානුකූල පරමාර්ථය වන්නේ ජනතාව බල ගැන්වීමයි. මෙම පරමාර්ථය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති අපහසුව වන්නේ සමාජ සජ්ජීතකරන්නන් තමන් විසින්ම අවශ්‍ය නොවන තරම් දේ සංවිධානය කරමින් තම ක්ෂේත්‍රය තුළ වීරයන් බවට පත්වීම හේතු කොට ගෙනය. ඔවුන් විසින් කළ යුතු වන්නේ අයිතිය ඉලක්ක ගත කණ්ඩායම්වලට භාරදී, ඔවුන්ගේ ප්‍රයත්නයන්ට සහයෝගය දීම පමණි. ව්‍යාපෘතියේ අවසන් ප්‍රතිඵලය සාක්ෂාත් කර ගැනීම සඳහා මෙය වඩාත් කාර්යක්ෂම විය හැකි නමුත් අප තේරුම් ගත යුතු කරුණක් වන්නේ එය ස්ථානීය බලගැන්වීම් සඳහා වන වඩා විශාල වූ අර්ථදායී ඕනෑම ක්‍රියාවලියකට බාධාකාරී විය හැකි බවයි. ඉහතින් සාකච්ඡා කළ පරිදි ක්‍රියාවලි නැඹුරුවකට වඩා ශක්තිමත් ප්‍රතිඵල නැඹුරුවක් වෙත පක්ෂපාතීවීමට හේතු සංවර්ධන නියෝජිතායතන පිළිබඳ කළමනාකරණ තර්ක තුළ මූලික වශයෙන් සොයාගත හැකි නමුත් ඒවා සමහර විට ව්‍යාපෘති සන්දර්භය තුළ මුහුණ දෙන විශේෂිත වූ අපහසුකම්වල ප්‍රතිඵලයක් ද වන්නේය:

- අරමුදල් වියදම් කිරීම පිළිබඳ වූ දැඩි උපලේඛන අනුව අවසන් කළ යුතු කාල වකවානුවලට තදින්ම යටත් වෙමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කෙටි කාලයක් ඇතුළත දෘශ්‍යමාන සහ ප්‍රමාණ කළ හැකි ප්‍රතිඵල ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ස්ථානීය තලයේ දී ස්වයං-ආධාර ක්‍රියාවලි හටගැන්වීමට එවැනි කාල පීඩනයක් අපේක්ෂිත ප්‍රතිඵලයට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලයක් ගෙන දීමක් විය හැකිය. බලගැන්වීම් ක්‍රියාවලිවල බලපෑම ප්‍රමාණාත්මක මිම්වලින් මැන බැලීම අපහසු වෙයි. මෙම මානය ඔස්සේ ව්‍යාපෘතියකට එහි සාර්ථකත්වය පැහැදිලි කිරීම හෝ ඔප්පු කිරීම සාධාරණ අන්දමින් බලාපොරොත්තු විය හැක්කේ කෙසේද?
- ප්‍රජාවක් තුළ බලගැන්වීම් සහ සමාජයීය ඉගෙනුම් ක්‍රියාවලි ආරම්භ කිරීම සඳහා අතිශයින් සංවර්ධනය වූ පහසුකම් සැලසීමක්, සන්නිවේදනය සහ සාකච්ඡා පිළිබඳ නිපුණතාත් අවශ්‍ය වේ. ස්ථානීය ප්‍රොත්සාහක ශක්තිය ධෛර්යමත් කිරීමට යෝග්‍ය වන්නා වූ අදාළ ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මෙන්ම ආකල්ප සහ හැසිරීම් සහිත සුදුසු සේවක පිරිස් බඳවා ගැනීම ද බොහෝ සංවර්ධන නියෝජිතායනවලට දුෂ්කර වී තිබේ.
- සංවර්ධන නියෝජිතායතන බොහෝ විට සහභාගිකත්ව ඇගැයුම් වාර්තා සකස් කිරීම සම්බන්ධයෙන් තවමත් (විශේෂයෙන්ම සහභාගීත්ව ග්‍රාමීය ඇගැයුම් විධි පාවිච්චි කරමින්) වෙහෙසක් දරයි. එහෙත් පසුව සිදුවිය යුත්තේ කුමක්ද යන කාරණය පිළිබඳව බොහෝ සෙයින් පැහැදිලි නැත. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයට එළැඹි කල ඔවුන්ට පරිපාලන සහ වාර්තා බලය පිළිබඳව ප්‍රශ්නවලට මුහුණපාන්නට සිදු වේ. බොහෝ විට ප්‍රජාව තුළ ඔවුන් විසින් ආරම්භ කරන ලද ක්‍රියාවලි පිළිබඳ පසු විපරම් කටයුතු කළ නොහැකිය. බොහෝ රටවල ගම් වැසියන්ට හැඟී යන්නේ නියෝජිතායතනය මගින් ඔවුන් අධි තක්සේරු කර ඇති බවය. පසුව කටයුතු කිහිපයක් ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරන විට ගම්වාසීන් බලාපොරොත්තු සුන් වූ තත්ත්වයකට පත්ව සිටී. ඉමහත් උනන්දුවකින් යුක්තව ඇගැයුම් ක්‍රියාවලිය සිදුවන අවස්ථාවේ තිබූ මූලික උද්යෝගය ඉතා පහසුවෙන් ඉච්ඡා භංගත්වයක් දක්වා පිරිහී යාමට ඉඩ තිබේ. සත්‍ය වශයෙන් ම කෙරෙන බලගැන්වීමක් සඳහා ගන්නා වූ ඕනෑම ප්‍රයත්නයක් සම්බන්ධයෙන් ගත් කල මෙය පැහැදිලිව අන්තරාදායී තත්ත්වයකි.



**කොටුව 4: ව්‍යාපෘති ආදර්ශයක් ජර්මානු සංවර්ධන සහයෝගීතාවයේ (ජී. ටී. ඉසෙඩ්) ත්‍රිකුණාමල ඒකාබද්ධ ආහාර සුරක්ෂා වැඩසටහන**

ත්‍රිකුණාමල ඒකාබද්ධ ආහාර සුරක්ෂා වැඩසටහන මේ වනවිට ශ්‍රී ලංකාවේ නැගෙනහිර කොටසේ ක්‍රියාත්මක වේ එය ද්විත්ව ව්‍යාපෘති මැදිහත්වීම් ක්‍රමෝපායන් අනුගමනය කරයි. සමස්ත ප්‍රජාවටම ප්‍රයෝජනවත් වන වත්කම් ප්‍රජා ව්‍යාපෘති විසින් උත්පාදනය කරන අතර (ඒවා බොහෝ විට වාසි සලසන්නේ ගොදුරු බවට ලක් විය හැකි කොටස්වලට වඩා මධ්‍යම පන්තියට සහ සමාජ ප්‍රභූන්ටය) ව්‍යාපෘතිය දුප්පත්කම හා සම්බන්ධ ව්‍යාපෘති ද ක්‍රියාත්මක කරයි. ඒවා විශේෂයෙන් ම අදාළ වන්නේ මෙම ගොදුරු බවට ලක්විය හැකි කණ්ඩායම්වලට පමණි (බවර් 1999). ව්‍යාපෘතිය මේ

ආකාරයෙන් නායකයන්ටද යමක් ලබාදෙන අතරම ප්‍රජාව තුළ සිටින දුප්පත් සහ වැඩි වශයෙන්ම වරප්‍රසාද නොලත් නිවැසියන්ට සහ තනි පුද්ගලයන්ට විශේෂිත උපකාර සඳහා කේවල් කිරීමට ඉඩකඩක් ලබාදෙයි.

ගොදුරු බවට ලක්විය හැකි කණ්ඩායම් හඳුනාගැනීමේ කාර්යයේ දී ගැමි නායකයින් සහ සමස්ත ප්‍රජාවම සහභාගීකරවා ගනිමින් හැකි තරම් දුරට පාරදෘශ්‍ය භාවය රැකීමට ව්‍යාපෘතිය බලාපොරොත්තු වෙයි. තේරීම සැමවිටම හඟවන්නේ සමහරුන් අනිවාර්යයෙන්ම තේරීමට හසු නොවන තත්ත්වයක බැවින් එය අතිශයින්ම සියුම් කර්තව්‍යයකි. ව්‍යාපෘතියේ ක්‍රමෝපාය වන්නේ සමස්ත ක්‍රියාවලිය තුළ ග්‍රාමීය නායකයින් රඳවා තබාගනිමින් දුප්පතුන් වෙනුවෙන් ඔවුන්ගේ සමාජ වගකීම පිළිබඳ හැඟීමට ආයාචනා කිරීමටය. ග්‍රාමීය ප්‍රභූ පිරිස බොහෝ සෙයින් නතු කරගෙන තිබෙන්නා වූ දැනට පවතින ප්‍රජා මූලික සංවිධාන සමග ව්‍යාපෘති එක් අතකින් සහයෝගයෙන් කටයුතු කරන අතර අනෙක් අතින් ගොදුරු බවට පත්විය හැකි කණ්ඩායම් වඩාත් හොඳින් නියෝජනය කරන විධිගත නොවූ කණ්ඩායම් සමගද සහයෝගයෙන් කටයුතු කරති.

ව්‍යාපෘතිය බලගැන්වීම සම්බන්ධයෙන් ප්‍රායෝගික ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙම අරමුණක් සහිත වූ (ආරම්මන) සමාජ සජ්ජීත ප්‍රවේශය (බිග් ඩොන් සහ ඒන්ජල් 2000) විසින් ප්‍රජා සජ්ජීත සලකනු ලබන්නේ ගැමි ක්‍රියාකාරකම්වල ව්‍යාපෘති චක්‍රයේ කේන්ද්‍රීය කාර්යය ලෙසයි. ප්‍රජාවන් සවිමත් කරනු ලබන්නේ කාර්යයක් කරන අතරතුරදීමය. එනම් සුළු ප්‍රමාණයෙන් සිදුවන ධාරිතා වර්ධනය ගොඩනැංවීමේ ක්‍රියාවලි හැටියට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ප්‍රජාව සජ්ජීතකරණය එකිනෙකට සම්බන්ධ වී ඇත (කෝර්ෆ් 2000). අප වටහාගත යුත්තේ මෙම ව්‍යාපෘතියේ පවත්නා සමාජ ක්‍රමයට එරෙහිව වරප්‍රසාද නොලත් අය බලගැන්වීමේ වෙනත් අභිලාෂකාමී සංකල්ප මෙම ප්‍රවේශය අතහැර දමා ඇති බවයි.



සංවර්ධන සහයෝගතාවය පිළිබඳ සන්දර්භයට අනුව සහභාගීත්වය සංවර්ධන සංකල්ප සඳහා තවත් අභියෝගයක් වන්නේ බහුජන බලපෑමක් සාක්ෂාත් කර ගැනීමය. තෝරාගත් ග්‍රාම සහ ප්‍රජා කොටස් අතර තිබෙන්නා වූ 'ව්‍යාපෘති දූපත්වලට' අදාළව බොහෝ විශාල ව්‍යාපෘති සැලකිය යුතු ප්‍රතිඵල සහ ජයග්‍රහණ ලබාගෙන ඇත. මෙය සාමාන්‍යයෙන් සිදුවන්නේ තිව්‍ර ස්ථානීය මැදිහත්වීම්වලට ප්‍රතිඵලයක් වශයෙනි. එම ප්‍රවේශය ගම්මාන විශාල සංඛ්‍යාවකට බුද්ධි ගෝචරව උපයෝගී කිරීම හා හැකිනම් රජයේ දෙපාර්තමේන්තුවල එදිනෙදා ක්‍රියාපටිපාටියට බද්ධ කිරීම සඳහා ව්‍යාප්ත කිරීම අසීරු කරුණක් වී තිබේ. මෙහි දී සහභාගීත්ව සංවර්ධන සංකල්ප සාමාන්‍යයෙන් සැලකිය යුතු අන්දමේ බාධාවලට මුහුණ දෙයි (බවර් සහ හොෆ්මන් 1997, බ්ලැක්බර්න් සහ හොලන්ඩ් 1998, චේම්බර්ස් 1994c). ව්‍යාපෘති සම්බන්ධ අයවැය සකස් කිරීමේ දී සහ කාලය තීරණය කිරීමේ දී රජයේ ක්‍රියාපටිපාටි අනම්‍ය වේ. සහභාගිකත්ව ක්‍රියාවලි සහ බලගැන්වීම් කෙසේ වුවද ඒවා ගැන කලින් කිව නොහැකිය.

සමහරවිට ඒවා මන්දගාමී වේ. ආයතන ගොඩනැංවීමේ හා සාමූහික ක්‍රියාකාරීත්වයේ ස්වශක්තිය මත කෙරෙන සංවර්ධනයට අතිශය හානිදායක තත්ත්වයක් ළඟා කර නොදී විධික්‍රමවලට ගැති වී තිබෙන ක්‍රියාපටිපාටි තුළට ඒවා කා වැද්දීම අසීරු ක්‍රියාවලියකි.

මෙම බාධක නොතකා ස්ථානීය සංවර්ධනය ප්‍රාණවත් කිරීම සඳහා සහභාගීත්ව ප්‍රවේශ වෙනුවෙන් ප්‍රයත්නයන් පවත්වාගෙන යාම තවදුරටත් අවශ්‍ය වේ එය කාර්යක්ෂමතාව සහ පිරිවැය කපා හැරීමේ හේතු සඳහා පමණක් නොවන අතර, සැපයීම් තත්ත්වය මඟහැරීමට සහ කොන් කරන ලද කණ්ඩායම් අතර, ස්වයං ආධාර සංකල්ප සහ බලගැන්වීමේ ක්‍රියාවලි ප්‍රාණවත් කිරීම සඳහාත් වේ. විශේෂයෙන්ම සංකීර්ණත්වයන් පවතින හදිසි අවස්ථාවලදී බලගැන්වීමේ ක්‍රියාවලි සහ පිළිගැනීම සියල්ල ඇතුළත් කර ගැනීමේ ප්‍රවණතාවක් ඇති බහුත්වවාදී සහ ඉවසා දරා සිටින සමාජයක් සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රජාතන්ත්‍රීකරණය ඇති කිරීමට තිබෙන ඒකායන මාර්ගයයි. සංවර්ධන ආධාර කමිටුවේ මෙහෙයුම් නිර්ණායකයන් අවධාරණය කර ඇති පරිදි ප්‍රචණ්ඩ නොවන ක්‍රියාමාර්ගවලින් ගැටුම් නිරාකරණය කර ගැනීමට ඒ මගින් හැකියාව ඇත.

*සහභාගීවීම හේතු කොට ගෙන සිවිල් සමාජය සහ ආර්ථිකය ශක්තිමත් වන්නේ රාජ්‍ය නිලධාරීන් සහ ආයතනයන් සමග සාකච්ඡා කිරීමට පුද්ගලයන්, ප්‍රජා කණ්ඩායම් සහ සංවිධාන බලගැන්වීම මගින්ය. ඒ අනුව මහජන ප්‍රතිපත්තියට බලපෑමක් ඇති කිරීමට සහ රජයේ බලය ගැන පිරික්සීමක් කිරීමට අවස්ථාව සලසා දෙයි. සාමකාමී අන්දමින් විසංවාදී අපේක්ෂා ගැන ක්‍රියා කිරීමේ දී සහභාගීවීම ද ආධාර සලසා දෙයි. සිවිල් සමාජය සහ ආණ්ඩුව අතර, නිර්මාණාත්මක අන්‍යොන්‍ය ක්‍රියාකාරීත්වයක් සඳහා සුදුසු වාතාවරණයක් ඇති කිරීම දීර්ඝකාලීනව සාමය ගොඩනැංවීමට අත්‍යවශ්‍ය උපාංගයක් වෙයි.*



එබැවින් හයවන (6) වන කොටස සංකීර්ණ වූ හදිසි අවස්ථාවන්හිදී බලගැන්වීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා සංවර්ධන ආධාර පිළිබඳව ක්‍රියාත්මකවීමට අවකාශයන් ලබාදීම ගැන වඩාත් සමීපව සොයා බලනවා ඇත.

## 6. ක්‍රියාකාරීවීම සඳහා අවකාශ

මෙම කොටසේ ප්‍රධාන අරමුණ වන්නේ සංකීර්ණ වූ හදිසි අවස්ථාවන්හි දී කෙතරම් දුරට සංවර්ධන නියෝජිතායතනවලට විශේෂිත කණ්ඩායම් බලගැන්වීමට දායකවෙමින් සහ අන්තර්ගත ප්‍රජාව සංවර්ධනය කරමින් කාර්යක්ෂම ආකාරයෙන් මැදිහත්විය හැකි ද යන්න ගැන සොයා බැලීමයි. ප්‍රශ්නය වන්නේ සංකීර්ණ වූ හදිසි තත්ත්වයන් සම්බන්ධ සන්දර්භය තුළ ක්‍රියාකාරී වීමට කෙතරම් දුරට අවකාශ තිබේද යන්නයි.

පැහැදිලි වශයෙන් ම බොහෝ සංවර්ධන මැදිහත්වීම්වල පරමාර්ථය වන්නේ ව්‍යූහාත්මක වෙනසක් ඇති කිරීමයි. එනම් යුක්ති සහගත නොවන සමාජ සම්බන්ධතා ව්‍යාවර්තනය සහ සහයෝගාත්මක සම්බන්ධතා නිර්මාණයට වඩාත් සුදුසු තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීමයි. බොහෝ මානව හිතවාදී ආධාර වර්ග සම්බන්ධ වඩාත් සම්ප්‍රදායානුකූල පැවරුම් ඇතුළත දුප්පත්කම සමනය කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහන් වේ. මෙම සැලසුම්වලින් පෙනී යන්නේ ඕනෑම සංවර්ධන මැදිහත්වීමක් සම්බන්ධයෙන් අවශ්‍යයෙන්ම තිබිය යුතු දේයි. ඒවා නම්,

- පළමුව අයුක්ති සහගත සමාජ සම්බන්ධතා හඳුනා ගන්න (ස්ථානීය තත්ත්වය යටතේ කොන් කිරීමට ලක් වී ඇත්තේ කවුද? එසේ නම් කෙසේද? ඇයිද? සහ කවුරුන් විසින්ද?). බොහෝ සංකීර්ණ වූ හදිසි අවස්ථාවන්හිදී විශේෂයෙන් වැදගත් වන්නේ මෙම තීරණ පැහැදිලි ගැටුම් සංදර්භ විශ්ලේෂණ පදනමක පිහිටුවීමයි. එහිදී විශේෂ අවධානය යොමු කළ යුත්තේ එහි කුඩා පරිමාණ (සූක්ෂම) සහ මහා පරිමාණ (සාර්ව) පිරිවිතර ගැන සහ කොන් කරන ලද කණ්ඩායම් සම්බන්ධයෙන් විධිමත්ව සකස් කරන ලද අවශ්‍යතා ඇගැයුමක් ද තිබීම ගැනයි. ස්ථානයේ මතුපිට තිබෙන තත්ත්වය ඉක්මනින්ම වෙනස්විය හැකි බැවින් ස්ථානීය සන්දර්භය අඛණ්ඩ අධීක්ෂණයට භාජන විය යුතුය.
- දෙවනුව අයුක්ති සහගත ව්‍යූහයන් කාර්යක්ෂම අන්දමින් ව්‍යාවර්තනය කිරීම සඳහා ක්‍රමෝපායක් විධිමත්ව සකස් කළ යුතුය. මෙහි දී මැදිහත්වන්නන් යුක්තිය පිළිබඳ ඔවුන්ගේ ප්‍රාමාණික උපකල්පන ඉතා පැහැදිලිව ප්‍රකාශ කිරීම අවශ්‍ය වේ. එසේ කළ යුත්තේ එවිට ඔවුන්ට වගකිව යුතු අන්දමින් හා පාරදෘශ්‍ය භාවයකින් යුක්ත අන්දමින් ක්‍රියා කිරීමට හැකි වීමයි. මේ හේතුවෙන් ස්ථානීය කොටස් කරුවන් සමග සහයෝගී සම්බන්ධතාවක් පවත්වාගෙන යාමට පදනමක් ලැබේ.
- තුන්වෙනුව අවශ්‍ය සහයෝගී සම්බන්ධතා නිර්මාණය වීමට සුදුසු තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා සැලැස්මක් වර්ධනය කළ යුතුය. විශේෂයෙන්ම මෙය ගැටුම්වල නිරත පාර්ශව අතරෙහි පමණක් නොව පොදුවේ ගත් කල ව්‍යාපෘති මැදිහත්වීම් සම්බන්ධයෙන් ඕනෑම තලයක දී විය හැකිය. උදාහරණයක් වශයෙන් ප්‍රජාව ගත හැකිය.

සාමාන්‍යයෙන් සංකීර්ණ වූ හදිසි අවස්ථාවකදී ප්‍රචණ්ඩකාරී මහා පරිමාණ ගැටුම් විශේෂිත වූ මානයන් ප්‍රදර්ශනය කර ඇත. මේ සම්බන්ධයෙන් සංවර්ධන ව්‍යාපෘතිවලට බලපෑමක් කළ නොහැකිය. එසේ තිබුණත් එය අතිශය සීමා සහිත වේ. මේවාට ඇතුළත් විය හැකි අංගය විය හැක්කේ ආයුධ සන්නද්ධ පිරිස් සිටීම, ස්ථානයේ සටන් ඇවිලී තිබීම හෝ සාමාන්‍ය ආරක්ෂක තත්වයයි. යුද්ධය හේතු කොට ගෙන තමන්ගේ ක්‍රියාකාරකම්වලට පැහැදිලිව බාධා තිබුණත් ව්‍යාපෘති නායකයන්ට පවතින තත්ත්වයන් ඇතුළත වැඩ කිරීමට සිදු වෙයි.



එහෙත් මැදිහත්වීමේ සන්දර්භයට බලපෑමක් ඇති කිරීමට ආධාර නියෝජිතායතනවලට ද හැකියාවක් තිබේ. වරදක් නොකරනු යන යථාදර්ශය පදනම් කරගෙන ක්ලේම් (2001) විශ්ලේෂණය සඳහා පාදක ව්‍යූහයක් හඳුන්වා දී ඇත. එය යුද්ධයේ නියෝජිතායතන කොටස සහ ව්‍යූහාත්මක කොටස අතර ආධාර නියෝජිතායතනවල බලපෑම පැහැදිලි කර පෙන්වයි. නියෝජිතායතනය ද කොටස යනුවෙන් ක්ලේම් අදහස් කරන්නේ යුද්ධය පිළිබඳව වගකීම පැවරිය හැකි නියෝජිතයන්ය. ඒ අය නම්, කැරලිකරුවන්, ආණ්ඩුව සන්නද්ධ හමුදා ආදියයි. අපේක්ෂාවකින් තොරව ආධාර දෙන නියෝජිතායතනය ඔවුන්ගේ මැදිහත්වීම හේතු කොට ගෙන පහසුවෙන්ම යුද්ධයට සම්බන්ධ එක පාර්ශවයකට හෝ අනෙක් පාර්ශවයේ සමාජ, සංස්කෘතික, ආර්ථික හෝ දේශපාලන තත්ත්වය ශක්තිමත් කිරීමක් සිදුවිය හැකිය.

නමුත් බොහෝ යුද්ධවල මූල සහ ගතික හේතු තුළ *ව්‍යූහාත්මක සංරචකයක්* ද අඩංගු වේ. උදාහරණයක් වශයෙන් ඒවා වන්නේ බොහෝ විට යුද්ධය සහ සාමය අතර, තීරණාත්මක වෙනසක් කරන්නේ ස්ථානීය තලයේදී විවිධ වාර්ගික ප්‍රජාවන් අතර, පවතින සම්බන්ධතාවය. ඔවුන්ගේ මැදිහත්වීම් සහ සම්පත් බෙදාහැරීම තුළින් මෙම ව්‍යූහය සම්බන්ධයෙන් සාධනීය හෝ නිෂේධනීය බලපෑමක් ඇති

කළ හැකිය. මෙහි දී ඒ අනුව ස්ථානීය තලයේ පවවතින්නා වූ සාමකාමී සබඳතාවලට ඇති ඉඩකඩ පුළුල් වීමට හෝ පටු වීමට ඉඩ තිබේ. පස්වන කොටුව පෙන්වා දෙනු ලබන්නේ එවැනි ව්‍යුහාත්මක සම්බන්ධතා වෙත යොමු කළ හැකි ව්‍යාපෘති මැදිහත්වීම්වල නිෂේධනාත්මක බලපෑම්ය.

**කොටුව 5 : ව්‍යුහාත්මක සම්බන්ධතා වෙත යොමු වන ව්‍යාපෘති මැදිහත්වීම්වල නිශේධණාත්මක බලපෑම් - ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වලින් උදාහරණ**

ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර කලාපවල ප්‍රජා තලයේදී සංවර්ධනය මැදිහත්වීම් හේතු කොටගෙන එකම ග්‍රාමයේ වාසය කරන්නා වූ වාර්ගික කොටස් අතර ගැටුම් ඉතා පහසුවෙන්ම උග්‍රවීමට (උදාහරණයක් වශයෙන් දෙමළ සහ මුස්ලිම්) හේතුවිය හැක්කේ ආධාර ලබාදීම සඳහා එක් කණ්ඩායමක් පමණක් තෝරාගතහොත්ය.

ප්‍රධාන වශයෙන් සිංහල ප්‍රදේශවලට සම්පත් යොමු කරමින් සිදුවන ව්‍යාපෘති මැදිහත්වීම තුළින් සිංහල ගොවි ජනපද එල්. ටී. ටී. ඊ. ප්‍රහාරවලට ලක් කිරීම පෙළඹවීමක් විය හැකිය.

ව්‍යාපෘති මැදිහත්වීම් හේතු කොට ගෙන පවුල් තලයේදී ගැටුම් නිර්මාණය වීමට ඉඩ තිබේ. එසේ සිදුවන්නේ ඔවුන් කාන්තාවන්ගෙන් සමන්විත කණ්ඩායම්වලට ආදායම් උපදවන ක්‍රියාවලිවලට සම්බන්ධවීමට පෙළඹවීමය. එම ව්‍යාපෘති මේ තාක් කල් ප්‍රධාන වශයෙන් පිරිමින්ට සීමාවී තිබීම මෙයට හේතුවයි.

විශේෂිත වූ ආරක්ෂා සහ යුධ තත්වයහි මුල් බැසගත්, ප්‍රජාව පදනම් වූ ගැටුම් පිළිබඳව ද නිරන්තරයෙන්ම ව්‍යාපෘති මැදිහත්වීම් හේතු කොට ගෙන පවුල් තලයේ දී ගැටුම් නිර්මාණයවීමට ඉඩ තිබේ. එසේ සිදුවන්නේ ඔවුන් කාන්තාවන්ගෙන් සමන්විත කණ්ඩායම්වලට ආදායම් උපදවන ක්‍රියාවලිවලට සම්බන්ධවීමට පෙළඹවීමය. එම ව්‍යාපෘති මේ තාක් කල් ප්‍රධාන වශයෙන් පිරිමින්ට සීමාවී තිබීම මෙයට හේතුවයි.



විශේෂිත වූ ආරක්ෂා සහ යුධ තත්ත්වයන් හි මුල් බැසගත්, ප්‍රජාව පදනම් වූ ගැටුම් පිළිබඳව ද නිරන්තරයෙන්ම ව්‍යාපෘති මැදිහත්වීම් ක්‍රියා කළ යුතුය. ඒවා නම් උදාහරණයක් වශයෙන් ගම්වැසියන් සහ අසල පිහිටි සරණාගත කඳවුරුවල නිවැසියන් අතර මතුවිය හැකි ගැටුම්ය. ආරම්භයේ දී මෙම සමාජ ගැටුම සාමාන්‍යයෙන් ප්‍රචණ්ඩ නොවේ. නමුත් හැමවිටම ප්‍රචණ්ඩත්වය දක්වා උත්සන්න වීමට හැකියාව තිබේ. එම නිසා ව්‍යාපෘතිය මේවා ගැන එළදායී අන්දමින් ඉදිරිපත් විය යුතු වේ. මෙහිදී ප්‍රචණ්ඩ නොවන ගැටුම් කළමනාකරණය වෙනුවෙන් සංවාද, සහයෝගී සම්බන්ධතා සහ යාන්ත්‍රණ සඳහා ඉඩකඩ නිර්මාණය කරන්නා වූ තත්ත්වයන්ට පහසුකම් සැලැස්විය යුතුය. එය පිළිගත යුතු කරුණක් වන්නේ බොහෝ විට මෙම ගැටුම් සම්පත් විෂය කොටගෙන ඇතිවන සුළු මතභේද හැටියට කල්පනා කිරීමයි. එහිදී අනන්‍යතාව සහ පිළිගැනීම පිළිබඳ තීරණාත්මක අංශ සාමාන්‍යයෙන් අතපසු වී යයි.

සංකීර්ණ වූ හදිසි අවස්ථා ඇතුළත බලගැන්වීම් ක්‍රියාවලි සඳහා පහසුකම් සැලසීමේ දී ආධාර දෙන නියෝජිතායතනවලට ඒවා විධිමත්ව හැසිරවීම සඳහා ක්‍රියාත්මක වීමට ඇති විෂය පථය සහ අවකාශ කවරේ ද? නියෝජිත ආයතනයෙන් සහ ප්‍රචණ්ඩ ගැටුමට සම්බන්ධ ව්‍යූහාත්මක කොටස්වලින් නිශේධනාත්මක පසු ප්‍රහාරයක් නිර්මාණය නොකර යථාර්ථයක් වශයෙන් ඔවුන්ට කළ හැක්කේ කුමක්ද?

සංවර්ධනය සඳහා වූ නියෝජිතායතනය වෙත තිබෙන ප්‍රධාන ඕනෑකම වන්නේ ආධාර සේවා සහ උපදෙස් අදාළ පාර්ශවයන්ට ලබාදීමයි. එසේම, කිසිම පාඩුවක් නොකරමින්, ස්ථානීය සටන් බිමේ ක්‍රියාත්මක වන ජනයා සමග සම්බන්ධතාවක් ඇති කර ගැනීම සඳහා ඵලදායී මාර්ග සෙවීමයි. සමහරවිට ස්ථානීය මට්ටමින් ගැටුම් ව්‍යාවර්තනය සඳහා දායකවීමට උත්දාම ගැනීමයි. එහෙත් ප්‍රජා සංවර්ධනය පිළිබඳ සන්දර්භය ඇතුළත සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් සාමය සඳහා ස්ථානීය හැකියාවන් ශක්තිමත් කිරීමට බලගැන්වීම් ක්‍රියාවලි යෝග්‍ය වන්නේ ද? ගැටුමක නිමග්න වී සිටින සමාජයක පළමු කාර්යභාරය වන්නේ ප්‍රචණ්ඩ නොවන ගැටුම් සමනය කිරීමේ යාන්ත්‍රණය ගැන නැවත ඉගෙනීම සහ අදාළ ආයතනික සැකසුම් නැවත ස්ථාපනය කිරීම යයි ප්‍රකාශ කිරීම තුළ, සාමය සඳහා දේශීය හැකියාවන් පදනම් කරගත් ප්‍රවේශය නිවැරදි නම්, ප්‍රජා සංවර්ධනය සඳහා සහභාගිකත්ව ප්‍රවේශ සඳහා ඇත්ත වශයෙන්ම ස්ථානීය කණ්ඩායම් සහ ස්වයං උපකාර ආයතන නැවත ගොඩනැංවීමත් මඟින් ක්‍රියාවලිවලට සහයෝගය දිය හැකිය. සංකීරණ වූ හදිසි තත්වයන්හි ප්‍රජා තලයේ සහභාගිකත්ව බලගැන්වීම් ක්‍රියාවලිවලට පහසුකම් සැලසීමේ ප්‍රයත්නයන්හි දී සහන සහ සංවර්ධනයට නැඹුරු වූ ආධාර දෙන ආයතන විශේෂයෙන් අපේක්ෂා කරන්නේ;

- සාකච්ඡා සඳහා වේදිකා නිර්මාණය කිරීම ධෛර්යමත් කිරීම (උදාහරණයක් වශයෙන් සහභාගිකත්වය ග්‍රාමීය ඇගැයුම් වැඩමුළුවල දී);
- ප්‍රජා මූලික සංවිධාන ආරම්භ කිරීම ශක්තිමත් කිරීම;
- ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා පටිපාටි නිර්මාණය ප්‍රවර්ධනය කිරීම (උදාහරණයක් වශයෙන් ප්‍රජා මූලික සංවිධාන කළමනාකරණය සඳහා කමිටු සෑදීමෙන්)
- ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලිය ඇතුළත විශේෂිත උනන්දු කණ්ඩායම්වල බද්ධවීම ප්‍රවර්ධනය කිරීම (උදාහරණයක් වශයෙන්, කාන්තා කණ්ඩායම්, තරුණ කණ්ඩායම් ආදිය ධෛර්යමත් කිරීම තුළින්)

දිග් ගැස්සෙමින් පැවැති යුද්ධයෙන් පීඩනයට පත් සියලු දෙනා ලැබූ අත්දැකීම්වල බලපෑම සලකා බලන විට පැහැදිලිවන කරුණක් වන්නේ ගැටුම් අවස්ථාවන් සඳහා සහභාගිකත්ව සහ බලගැන්වීම් ප්‍රවේශ හඳුන්වාදීම පහසු කාරණයක් නොවන බවයි. ගැටුම් පවතින ප්‍රදේශවල සිටින අදාළ අයවලුන්ට කිසිම ආකාරයක තීරණයක් ගැනීමෙන් වැළකී සිටීමට සාමාන්‍යයෙන් බොහෝ කාලයක් තිස්සේ සිදු වී තිබේ. ඔවුන්ගේ එදිනෙදා ජීවිතයට ඍජුවම බලපාන සුළු කරුණුවලදී පවා තත්ත්වය එසේ වන්නේය. විශේෂයෙන්ම සරණාගතයින් සහ අභ්‍යන්තර වශයෙන් අවතැන්වී සිටින පුද්ගලයන් කාලයක් තිස්සේ සහනාධාරවලින් යැපෙන පිරිසක් බවට පත්ව සිටී. ඒ අනුව ඔවුහු සුභ සාධන ආධාර ලබන්නා වූ නිහඬ පිරිසකි.

මේ ආකාරයෙන් වූ යැපීම් සින්ඩ්‍රෝමය යටතේ මිනිසුන්ට තමන්ගේම ජීවිත පිළිබඳව කිසිම ආකාරයක තීරණයක් ගැනීම අනුක්‍රමයෙන් නොහැකි වී තිබේ. ඔවුන් ජීවත් වන්නේ සරණාගත කඳවුරුවලය. බොහෝ විට ඒවායේ දැඩි නීති පනවා ඇත මානව හිතවාදී නියෝජියතන මගින් ලබාදෙන සහන පදනම් කරගෙන යැපෙති. එම ආයතන ද දැඩි කොන්දේසි පනවා ඇත. යුද නායකයින් සහ ප්‍රදේශයේ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඒකාධිකාරය උසුලන අයවලුන් ජනතාව මත ඔවුන්ගේ තීරණ සහ පාලන ක්‍රමය බලයහහත්කාරයෙන් පටවති. ස්ථානීය තලයේ දී ජනතාව සංවර්ධන ක්‍රියාවලීන්ට නැවත බද්ධ කිරීම ඒ අනුව සිවිල් සමාජයේ ආයතනික සැකසුම් නැවත ස්ථාපනය කිරීම සඳහා සහ ප්‍රජා තලයේ දී පොදුවේ සහභාගීවීම අවශ්‍ය ගාමක බලයක් ලබාදීමට හැකිවනු ඇත.

සචිතානන්දන් (1996, 206 පිටුව) විශේෂ අවස්ථාවක් විස්තර කරමින් පවසන්නේ එවන් ක්‍රියාවලියකට ජනතා සහභාගීත්වය දිරිමත් කරන ලද්දේ සුළු පරිමාණ ණය හා ඉතිරි කිරීම් ව්‍යාපෘති මාර්ගයෙනි. මෙහිදී අලුතින් ස්ථාපනය කරන ලද ප්‍රජාව පදනම් කරගත් ඉතිරි කිරීම් සංවිධානවලට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා පටිපාටි සාර්ථක අන්දමින් බද්ධ කරගන්නා ලදී. එම කාරණයේ දී, මුදල් කටයුතු, ව්‍යාපෘති සහ ප්‍රතිලාභීන් පිළිබඳ සියලු ප්‍රධාන තීරණවලට වගකීම ඡන්දයෙන් තෝරාගන්නා ලද විධායක කාරක සභාවක් වෙත පැවරුණි. කමිටුවේ ක්‍රියාපටිපාටි පිළිබඳ නීති යටතේ විවිධ ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණ වන විධිමත් ප්‍රතිපෝෂණය, ව්‍යුහගත අධීක්ෂණය, සහ මාරුවෙන නායකත්වය පියවරෙන් පියවර සංවර්ධනය කරන ලදී. ඒ අනුව සංවිධානය අභ්‍යන්තරයේ ඇතිවන ගැටුම් මැඩපවත්වා ගැනීමට එම වැඩපිළිවෙල උපකාරී විය.



කමිටුවේ ක්‍රියාකාරීව කටයුතු කිරීමට, විශේෂයෙන්ම කාන්තාවන් ධෛර්යමත් කරන ලදී. සාමාන්‍ය වශයෙන් ගත් කල මැදිහත්කරුවන්ට දැකගත හැකි වූයේ මේ ආකාරයේ ප්‍රජා මූලික ඉතිරි කිරීමේ සංවිධාන විවිධ ක්‍රියාකාරී අංශ අතර ඇති බලය පිළිබඳ සම්බන්ධකම් ප්‍රමාණවත් පිරික්සුමකට හා බල තුලනයකට යටත් කිරීමෙන් සහ ඡන්දයෙන් තෝරාගන්නා ලද කමිටු පාවිච්චි කිරීමෙන් ඇත්ත වශයෙන්ම ස්ථානීය ජනතාවගේ සහභාගීත්වය අධික ලෙස වැඩි විය. මේ හේතුවෙන් සංවිධානයේ සාමාජිකයින් අතර, අයිතිය පිළිබඳ නියමාකාර හැඟීමක් ඇති විය.

කෙසේ වුවද එවන් සංජානනය වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියකට බොහෝ කාලයකට බල පවත්වන ඉමහත් භෞතික සහ මානව සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ ප්‍රතිඵල බොහෝ විට තිරසාර නොවන බැවිනි. වෙනස්වන බිම් මට්ටමේ තත්ත්වයන් හේතු කොට ගෙන පමණක් විශේෂයෙන්ම ආරක්ෂාව සම්බන්ධයෙන් ගත් කල එයට එක් දවසක් පාසා තම ගෙවල් අත්හැර යන මෙන් ජනතාවට බල කළ හැකිය. එබැවින් එවන් ප්‍රයත්නයන් පලක් ඇති වැඩක්දැයි යන්න හුදු ප්‍රශ්න කිරීමට වඩා ප්‍රබල වෙති: බොහෝ විට ඒවා පෙනෙන්නේ පලක් නැති වැලි මාළිගා ගොඩනැගීමක් ලෙසය. එසේ වුවත්, සමහර කතුවරු තර්ක කරනු ඇත්තේ ඒ වටිනා බවයි; එසේ වන්නේ ඒවා තමන්ගේම ප්‍රජා මූලික ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ගොඩනගා ගැනීමට ජනතාවට උගන්වන බැවිනි; කැප වූ නායකත්වය ද එයට ම සම්බන්ධ වේ. ඒවා කළමනාකරණ නිපුණතා සහ ප්‍රජා සහ පාලන ව්‍යුහයන් පිළිබඳ අවබෝධයක් අත්පත් කර ගැනීමට ද උදව් වෙයි. ඒවා විනාශ වුවත්, කළබලකාරී තත්ත්වයන් පහව ගිය පසු මෙම ආයතන නැවත ගොඩනැංවිය හැකිය.

ප්‍රජා තලයේදී ස්ථානීය බලගැන්වීමේ ක්‍රියාවලි සහ ආයතන ගොඩනැංවීමේ අනපේක්ෂිත බලපෑම් පැහැදිලිව විස්තර කරන්නාවූ වෙක් උදාහරණ ද ඇත. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුදා නොගත් ප්‍රදේශයක (එල්. ටී. ටී. ඊ පාලනයේ) කටයුතු කරන ඉසඩ් ඕ ඒ (ZOA) නම් ඕලන්ද රාජ්‍ය නොවන සංවිධානයක් පවත්වාගෙන යන ඉතිරි කිරීමේ ව්‍යාපෘතියක් ක්ලේම් (2001) විස්තර කරයි. මෙම ව්‍යාපෘතිය ආරම්භයේ දී බලාපොරොත්තු වූයේ ඉතිරි කිරීම් චක්‍රීය ණය අරමුදල් යාන්ත්‍රණයකින් අතිශයින් ගොදුරු බවට ලක් වූ යුද්ධයෙන් පීඩිත දුප්පත් ජනතාව බලගැන්වීමට වන අතර, එය පසු කාලයේදී අලුතින් ආරම්භ කරන ලද ග්‍රාමීය ඉතිරි කිරීම් සංවිධානය කෙරෙහි තිබෙන්නා වූ සැහෙන එල්. ටී. ටී. ඊ. බලපෑම සහ බලය හෙළිදරව් වීමට හේතු විය. කාලය ගෙවීයත් ම ඉතිරි කිරීම් කමිටුවලින් හඳුනාගෙන තිබූ සංවර්ධන ව්‍යාපෘතිවලට පරිබාහිර ඒවාට අරමුදල් හරවා යවන ලදී. එසේ කිරීමට ආපසු බලපාන පරිදි තීරණ ගැනීම කරන ලද්දේ එල්. ටී. ටී. ඊ ය විසිනි. මෙසේ කිරීමේ දී ඉතිරි කිරීම් කමිටුවල තීරණ ගැනීමේ ක්‍රියාවලි ප්‍රබල අන්දමින් අභිබවා ගොස් ඇත. පහසුකම් සලසන්නා වූ ආධාර නියෝජිතායතනය වක්‍රාකාරයෙන් එල්. ටී. ටී. ඊ. ය ශක්තිමත් කිරීමේ කාර්යභාරයක් ඉටු කිරීම ගැන අපහසු තත්ත්වයකට පත් වන්නේ ඔවුන් ඇත්ත වශයෙන්ම බලාපොරොත්තු වූයේ ස්ථාන කණ්ඩායම් සහ ව්‍යූහයන් බලගැන්වීමය. ඔවුන් නියමාකාර උභතෝකෝටියකයකට මුහුණ දී ඇත. එකම විකල්පය වූ ඉතිරි කිරීම් වැඩපිළිවෙල ඉවත් කර ගැනීම සාධාරණ විසඳුමක් නොවීය. එසේ කළහොත්, යුද්ධයෙන් පීඩාවට පත් කණ්ඩායම් දුබල කිරීමක් හෝ ගොදුරු බවට ලක් කිරීමක් සිදු වේ.

ක්ලේම් පෙන්වා දෙන තවත් අනපේක්ෂිත ප්‍රතිවිපාකයක් නම් ආයුධ සන්නද්ධ කණ්ඩායම් වන හමුදාවේ සහ එල්. ටී. ටී. ඊ යේ තර්ජනවලට ප්‍රජාවන් අතර තිබෙන්නා වූ සමාජව්‍යූහයන් කෙරෙහි ඕනෑම ආකාරයක ව්‍යාපෘති මැදිහත්වීමකට වඩා බලපෑමක් ඇති කළ හැකි බවයි. මෙම කාරණය පිළිබඳ එක් උදහරණයක් ත්‍රිකුණාමලයේ සරණාගත කඳවුරකින් ඉදිරිපත් කෙරේ. එහිදී කඳවුරු නිවැසියෝ ස්ථානීය ප්‍රජාවගේ සහයෝගය ඇතිව හමුදා මූලස්ථානයේ දී විරෝධතාවක් දැක්වූහ. එසේ කළේ එල්. ටී.ටී.ඊයට සම්බන්ධයයි, සැකකොට වෙඩි තැබීමකට ලක් වූ තම ඥාතීන්ගේ මෘත ශරීර නිදහස් කර ගැනීමටය. හමුදාව ප්‍රතිචාරය දැක්වූයේ ස්ථානීය ජනතාවට තර්ජනය කිරීමෙනි. ඔවුන්ගේ ආඥාව වූයේ හවස 6.00 න් පසු වීදියේ සිටින ඕනෑම තරුණයෙකුට වෙඩි තබන බවයි. මෙම තර්ජනයෙන් බිය පත්වී ස්ථානීය ප්‍රජාව සරණාගත කඳවුරේ රැඳවියනට දැක් වූ සහයෝගය ඉවත් කරගන්නා ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම කණ්ඩායම් දෙක අතර තිබූ සමාජ සම්බන්ධතාව පිරිහීමකට ලක් විය. ගැමි ප්‍රජාව හමුදාව සහ ප්‍රශ්න ඇති කරගත් පසු විවෘත එදිරිවාදිකම් ඉස්මතු විය. ඇති වූ අපහසුකම්වලට ඔවුන් වරද පැවරුවේ සරණාගත රැඳවියන් වෙතය. මේ සියල්ලෙන් නැගෙන ප්‍රශ්නයක් ඇත. එනම් තර්ජනාත්මක තත්ත්වයන්හි දී බලගැන්වීමේ ක්‍රියාව ක්‍රියාත්මක කළ හැකිද? නැතිනම් ධූරාවලීමය හා ආඥා දායක බල ව්‍යූහයන් සම්බන්ධ සන්දර්භය තුළ එය කළ හැකිද? එහිදී පෙනී යන්නේ බලගැන් වූ තත්ත්වයකට පත් වනවාට වඩා බෙලහීන තත්ත්වයකට පත්වී ඇති බවයි; එයට හේතුව ක්‍රියාත්මකවීමට ඇති ඉඩකඩ පටු වී යාමයි.

ඇත්ත වශයෙන්ම, ප්‍රචණ්ඩකාරී වාතාවරණයක ස්ථානීය ජනතාව සමග බලගැන්වීම් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමට ප්‍රයත්න දැරීම ගින්දර සමග සෙල්ලම් කිරීමක් වීමට ඉඩ තිබේ (ගුඩ් හැන්ඩ් සහ ලෙවර් 1999). ශ්‍රී ලංකාවේ යුද්ධයෙන් ඇළලී ගිය ප්‍රදේශ සම්බන්ධ සන්දර්භය අනුව දැක ඇති පරිදි ස්ථානීය

නායකයින්, විශේෂයෙන්ම සමාජ ව්‍යවසායකයින් බොහෝ විට ප්‍රචණ්ඩත්වයේ තර්ජනයට භාජනය වී ඇත. මරා දැමීමකට ලක් වීමේ හෝ තුවාලවීමේ බියක් ඔවුන් තුළ පවතී. ඒ හේතු කොට ගෙන ඔවුහු ස්ථානීය නායකයන් වශයෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටීමට බියක් දක්වති. කැපී පෙනෙන තත්ත්වයට ද කැමැති නැත්තේ එවන් අනාවරණයක් හේතුවෙන් සටන්කාමී කණ්ඩායම්වලට පහසුවෙන් ගොදුරු වීමට ඉඩ ඇති බව ඔවුන් අවබෝධ කරගෙන ඇති හෙයිනි. ඒ අනුව ගැමි පාර්ශවයන් නිරන්තරයෙන්ම සුපරික්ෂාකාරීව බලා සිටින්නේ කවුරු කුමන කියාවලියක් තමන්ගේ විශේෂිත වූ බලපෑම් සහිත ක්ෂේත්‍රය තුළ ආරම්භ කරන්නේද යන්න ගැනයි.

යුද්ධයෙන් ඇළලී ගිය ශ්‍රී ලංකාව පිළිබඳ අත්දැකීම් පැහැදිලි කරන්නේ ගැටුමට සම්බන්ධ විවිධ පාර්ශවයන්ගේ ඕනෑ එපාකම් තුලනය කිරීම පිළිබඳව සංවර්ධන නියෝජිතායතන අතිශයින් සුපරික්ෂාකාරී විය යුතු බවයි. ඒ අතරම තම පරමාර්ථයන් වන දුප්පත්කම සමනය, කිරීම, ආහාර සුරක්ෂාව හෝ ස්වයං ආධාර ප්‍රවර්ධනය යන කාර්යයන් කරගෙන යා යුතු වේ. ඔවුන් සම්මුතියකදී කෙතරම් දුරකට යාමට සූදානම් ද? ඔවුන් හොඳ දේට වඩා නරක දේ කරන බව පිළිගත්තේ කුමන අවස්ථාවේ දී ද? සැබවින් සිදුවන්නේ බලයේ සිටින කණ්ඩායම් නිත්‍යානුකූල කිරීම සහ ස්ථාවර කිරීම නොවේද? මැදිහත්කරුවන් සැමවිටම අවබෝධ කර ගත යුතු කරුණක් වන්නේ ඔවුන්ගේ ප්‍රයත්න හේතුකොට ගෙන සහයෝගයක් ලබන්නේ කුමන කණ්ඩායම් ද යන්න පිළිබඳවයි. ඔවුන් සමහරවිට සොයාගන්නවා ඇත්තේ සංකීර්ණ වූ දේශපාලන හදිසි අවස්ථා සම්බන්ධ විශේෂිත වූ පරිසරයක් තුළ වඩාත් වාර්ගික වශයෙන් තුලනාත්මක වූ ක්‍රමෝපායක් වෙනුවෙන් අවශ්‍යතාවයට නැඹුරු වූ ප්‍රවේශයක් (වාර්ගිකත්වය නොසලකා අන්ත දුප්පත් අයට උපකාරීවන) අත්හැර දැමීමට අවශ්‍යවීමට සමහරවිට ඉඩ තිබේ (බිග් ඩෝන් සහ කොර්ෆ් 2000).



සංකීර්ණ වූ ගැටුම් තත්ත්වය යටතේ කටයුතු කරන විට ව්‍යාපෘති මැදිහත්වීම් නිතරම මුහුණ දෙන උපතෝකෝටිකයන් සැලකිල්ලට ගන්නා ක්ලේම් (2001) නිර්දේශ කරන්නේ 'වියත් උපයෝගිතාවාදී' ආකල්ප ක්‍රමෝපායකි. මූලික වශයෙන් මෙහි අර්ථය වන්කේ එක් කාර්යයකින් පසු තවත් කාර්යයක් (උපයෝගී ක්‍රමය) සලකා බැලීමේ පදනම මත ප්‍රායෝගිකත්වයක් අනුගමනය කිරීමයි. ඒ අතරවාරයේ ම ප්‍රස්තුත කරුණුවල අදාළ බව සහ සංකීර්ණතාව (උගත් බව) සැලකිල්ලට ගනු ලැබේ. මෙහිදී වැදගත් කාරණය වන්නේ තමුන් මුහුණපාන උභතෝකෝටිකයන් පිළිබඳව ආධාර දෙන නියෝජිතායතන දැනුවත් වී, සමස්තයකට එකඟ වන්නේ කුමන අවස්ථාවේ දී ද සහ පිළිගත් හර ඇගැයුම්වලට එළඹ ගන්නෙ කුමන අවස්ථාවේදීද යන්න සුපරික්ෂාකාරීව තීරණය කළ යුතුය.

ගැටුම් අවස්ථාවල ස්වභාවය ගත් කල ඒ ගැන නිත්‍ය වශයෙන්ම කලින් ප්‍රකාශ කළ නොහැකි බැවින් ව්‍යාපෘති වුවද නම්‍යශීලී (සචිතානන්දන් එයට පවසන්නේ "ව්‍යූහගත කිරීමකින් තොර" යනුවෙනි) ප්‍රවේශ අනුගමනය කළ යුතුය. වෙනස්වන තත්ත්වය යටතේ ඉලක්ක ගත කණ්ඩායම්වල විවිධ වූ ක්ෂණික අවශ්‍යතාවලට ප්‍රතිචාරයක් දැක්වීමට ඔවුන්ට ඉඩදිය යුතුය (සචිතානන්දන්, 1998). මෙය ආධාර දෙන නියෝජිතායතනවල කළමනාකරණ තර්කය සමග බද්ධකිරීම ඇත්ත වශයෙන්ම අසීරු කරුණක් වනු ඇත.

ප්‍රජා සංවර්ධන කාර්යයන්හි අත්‍යන්ත පරමාර්ථය විය යුත්තේ කේවෙල් කිරීම සඳහා ආයතනික සැකසුම් ශක්තිමත් කිරීමට මෙන්ම සාමූහික ක්‍රියාමාර්ග සඳහා යෝග්‍ය වූ සහ බද්ධ වූ විසඳුම් සාකච්ඡා

කිරීමය. මෙවැනි තත්ත්වයන් හේතුකොට ගෙන ගොදුරු බවට ලක් විය හැකි කණ්ඩායම්වලට තම සාධාරණ අයිතිය පිළිබඳ හඬ නැංවීමට අවස්ථාද සැලසේ. අනික් අයට පාඩු සිදුවන පරිදි ඔවුන්ගේ ක්‍රියාවලිය කවර ආයතන ශක්තිමත් කළේද යන්න හරියාකාරව මැදිහත්වන්නන් විසින් තක්සේරු කිරීම ද තීරණාත්මක කරුණකි. ප්‍රජා මූලික සංවිධාන සම්බන්ධයෙන් නව ව්‍යුහයන් ගොඩනැංවීම මඟින්, උදාහරණයක් වශයෙන්, ග්‍රාමීය තලයේ අනෙකුත් ආයතන දුර්වල කළ හැකිය. ඒවා නම් සම්ප්‍රදායික අධිකාරීන් හා ප්‍රාදේශීය පාලනයේ රාජ්‍ය ආයතනයි. මැදිහත්වනන්නන් මෙම ආතයතනවල කාර්යභාරය, සමස්ත ගැටුම් තත්ත්වය තුළ සුපරීක්ෂාකාරීව සලකා බැලිය යුතුය. ඔවුන් සාමය සඳහා විභවාත්මක හැකියාවන් ඉදිරිපත් කරනවාද? වඩාත් ඇතුළත් කර ගැනීමේ තත්ත්වයකට පත් කර ගැනීම සඳහා ඔවුන් ප්‍රතිසංස්කරණය කළ හැකිද? එනම් වරප්‍රසාද නොලත් කණ්ඩායම්වලට පවා ඉඩකඩ ලබාදෙමින් ඒ කළ හැකිද?

තවත් වැදගත් දෙයක් වන්නේ පහසුකම් සලසන්නන් හෙවත් සමාජ සජ්ජිතකාරකයින්ගේ කාර්යභාරයයි. බලගැන්වීමේ ක්‍රියාවලට සහයෝගය දැක්වීම සඳහා දැනට කෙරී ගෙන යන ප්‍රයත්නයන්හි දී පහසුකම් සලසන්නා සමහරවිට මැදිහත්කරුවෙකු වශයෙන් ක්‍රියාකිරීම ද අවශ්‍ය වේ. මෙහිදී ග්‍රාමයේ තිබෙන්නා වූ විවිධ අපේක්ෂා කණ්ඩායම් පිළිබඳව සුපරීක්ෂාකාරීව සැලකිලිමත් විය යුතුය. මෙයින් අදහස් කරනු ලබන තවත් කරුණක් වන්නේ සන්නිවේදන හැකියාවන්වල සහ මහජන රැස්වීම්වල දී සාකච්ඡා කිරීමේ හැකියාවල අසමානත්වතා තුලනය කිරීම. ඔහු හෝ ඇය විසින් කළ යුතු වේ. එමෙන් ම ගොදුරු බවට ලක්විය හැකි කණ්ඩායම්වලට ඔවුන්ගේ අපේක්ෂාවන් ආරක්ෂා කර ගැනීමට කරුණු ඉදිරිපත් කිරීම සඳහා වන ප්‍රයත්නයන්හි දී සහයෝගය දැක්විය යුතුය. මෙහිදී සැමවිටම මධ්‍යස්ථ ස්ථාවරයක සිටිය යුතු අතර සියලු පාර්ශවයන්ගේ සහයෝගය සහ විශ්වාසය දිනාගත යුතු වේ.



මෙම මූලික විශ්වාසය සහ විවිධ වූ සියලුම කොටස්කරුවන්ගේ පිළිගැනීම ප්‍රජා පහසුකම් සලසන අයට අවශ්‍ය වේ. බොහෝ ස්වදේශීය කාර්ය මණ්ඩල ගැටුමේ එක් පාර්ශ්වයකට හෝ අනික් පාර්ශ්වයට ඇති කිසියම් ආකාරයක සම්බන්ධතාවක් හේතු කොට ගෙන සංකීර්ණ වූ දේශපාලනමය හදිසි තත්ත්වයන්ට පැමිණෙන්නට ඉඩ තිබේ. මේ තත්ත්වයට හේතු විය හැක්කේ එක්තරා වාර්ගික කණ්ඩායමක්, සමාජ පංතියක් හෝ කිසියම් දේශපාලන පක්ෂයක් සමග ඇති සම්බන්ධතාවක් නිසා විය හැකිය. ඥාති සංග්‍රහයට නැඹුරු පාලනයන්හි දී සහ බොහෝ සිවිල් යුද්ධවලදී ගැටුමට සම්බන්ධ පාර්ශ්ව සහ බලවත් කොටස්කරුවෝ බොහෝ විට ප්‍රජා ක්‍රියාවලි සමග බාධාකාරීව ගැටෙමින් ස්ථානීය තලයේ දී ඔවුන්ගේ නියෝජිතයින් සහ ඕනෑ එපාකම් ස්ථාපනය කිරීමට සැරසෙති. ඒ අනුව පහසුකම් සලසන්නන්ගේ බලය සීමිත වෙයි. දේශපාලන අනුග්‍රාහකයින් හෝ යුද නායකයින් සමග විශේෂිත වූ සම්බන්ධකම් සහිත ක්‍රියාකාරී පුද්ගලයින් නිසා කේවෙල් කිරීමේ ක්‍රියාවලියේ දී ඔවුන්ට අභියෝග කිරීමට පහසුකම් සලසන්නෝ බිය වෙති. පහසුකම් සලස්නන්ගෙන් බලාපොරොත්තු වන ගැටුම් කළමනාකරණ නිපුණතා ඉතා වැදගත් වේ. ඒවා කිසිසේත් අවතක්සේරු කළ යුතු නොවන අතර ක්‍රමානුකූල පුහුණු කිරීම් සහ අධීක්ෂණය තුළින් ශක්තිමත් කළ යුතු වේ.

සහභාගීවීම, බලගැන්වීම, සහ ගැටුම් ව්‍යාවර්තනය අතර, තිබෙන්නා වූ බන්ධනයේ ප්‍රධාන අංශ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ප්‍රජා සංවර්ධන ක්‍රියා පිළිබඳ සන්දර්භයේ දී, සහභාගිකත්ව සහ බලගැන්වීම් සම්බන්ධ සමහර සංකල්පීය සහ ප්‍රායෝගික ප්‍රශ්න ද ගවේෂණය කරමින් අප දැන් උත්සාහ

ගත යුත්තේ මෙම ප්‍රවේශයන්හි හැකියාවන් සහ සීමාවන් පිළිබඳ මූලික ඇගැයීමක් කිරීමටය. එහි දී ගැටුම් ව්‍යාවර්තනය සහ ස්ථානීය සාමය ගොඩනැංවීමේ සංදර්භයේ දී ඒවායේ කාර්යභාරය ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ. එවැනි ඇගැයීමක් පරිපූර්ණ එකක් සේ නොසැලකෙනවා ඇත. නැතිනම්, එය ක්ෂේත්‍ර කටයුතු සඳහා වන නිශ්චිත සැලැස්මක් වශයෙන් ද නොසැලකෙනු ඇත. හයවන (6) කොටුවේ සලකා බලන කරුණු ප්‍රධාන වශයෙන් පදනම් වන්නේ, ශ්‍රී ලංකාවේ යුද කලාපයේ සංවර්ධන සහයෝගතා පිළිබඳ අත්දැකීම් මතය. එහි පිළිබිඹු වන්නේ සංකීර්ණ වූ දේශපාලන හදිසි අවස්ථාවේ සන්දර්භානුග විශේෂ වූ කරුණුයි.

**කොටුව 6 :**
**ස්ථානීය ගැටුම් විපරිවර්තනය කෙරෙහි ඇතිවන බලපෑම සම්බන්ධ සහභාගිකත්ව සහ බලගැන්වීම් ප්‍රවේශයන්**

| හැකියා | බාධක |
| --- | --- |
| ප්‍රජා තලයේ තීරණ ගැනීමේ දී සහභාගිකත්ව විධි පාරදෘශ්‍යභාවයට ආධාර කරයි. | ව්‍යාපෘති සම්පත් හෝ ප්‍රජා තලයේදී පිළිගැනීම සඳහා වන කේවෙල් කිරීමේ ක්‍රියාවලි අලුත් ගැටුම් උත්සන්න කිරීමේ හෝ ගැටුම් ඇතිවීමේ හැකියාවන් වැඩිවීමේ සහජ අනතුරු දායක තත්ත්වය දරා සිටී. |
| සහභාගිකත්ව ග්‍රාමීය වැඩමුළුවලට වේදිකා සපයාදිය හැකිය. ඒවා ප්‍රයෝජනයට ගනිමින් විවිධ උපාය මාර්ගික සහ සමාජයීය කණ්ඩායම්වලට තම තත්ත්වයන් ප්‍රකාශයට පත් කළ හැකිය. ඒ පරිදි ප්‍රජා සංවර්ධනයට ස්ථානීය කේවල් කිරීම් සහ සාකච්ඡා ක්‍රියාවලි සඳහා සහයෝගය දිය හැකිය. | ස්ථානීය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ ප්‍රජාවේ පහසුකම් සලසන අය ප්‍රශ්නයේ කොටසක් විය හැකිය. සමාජීය ක්‍රමයේ කොටසක් වශයෙන් ඔවුහු විශේෂිත සමාජ, වාර්ගික හෝ දේශපාලන කණ්ඩායම්වලට හා ව්‍යාපාරයට පක්ෂපාතීව නැඹුරු වෙති. (නැතිනම් එසේ වනවා යැයි අනික් අය අදහස් කරති) |
| සාමය සඳහා ස්ථානීය ධාරිතාවන් ගොඩනැගීමට සම්පතක් වශයෙන් ස්ථානීය ආයතනික සැකසුම් සහ සමාජ ප්‍රාග්ධනය (නැවත) ස්ථාපනය කිරීමට සහභාගීවීම මගින් දායක විය හැකිය. | සාකච්ඡා ක්‍රියාවලිවල පාරදෘශ්‍යභාවයට සියලු සංස්කෘතික වටපිටාව ප්‍රවර්ධනය කිරීම පහසු නොවේ. |
| සහභාගිකත්ව ක්‍රියාවලි ප්‍රචණ්ඩත්වය හෝ අනුග්‍රහය සම්බන්ධ සංස්කෘතියකට ප්‍රතිවිරුද්ධව භාෂණ සංස්කෘතියක් ස්ථාපිත කරයි. | ආඥාදායකත්ව සහ ධූරාවලි ක්‍රම සංවාදශීලී ක්‍රියාවලි අධෛර්යමත් කරයි. |
| බලගැන්වීම් ක්‍රියාවලිවල ගොදුරු බවට ලක්විය හැකි කණ්ඩායම් ශක්තිමත් කොට තමන්ගේම අපේක්ෂා සහ අවශ්‍යතා ප්‍රකාශ කිරීමේ (පක්ෂව කතා කිරීම) පදනමක් වශයෙන් පොදු අනන්‍යතාවක් නිර්මාණය කළ හැකිය. | අනිත් අතට සංස්කෘතික සම්ප්‍රදායයන්ට ඇඟිලි ගැසීම බටහිරකරණය වූ අදහස්වල යටත්විජිත ක්‍රමයේ කාවැද්දීමක් ලෙස පහසුවෙන්ම සිතා ගැනීමට ඉඩ ඇත. |

| හැකියා | බාධක |
|---|---|
| සහභාගිකත්ව ක්‍රියාවලි මගින් කෙරෙන ප්‍රජා සංවර්ධනයට පාලන ක්‍රමයේ විවිධ තලයන් අතර (දුප්පත් සහ පොහොසත්, සේවා සපයන අය සහ ප්‍රජා, විවිධ පරිපාලන තල) සම්බන්ධකම් නිර්මාණය කිරීම හෝ (නැවත) ස්ථාපනය කිරීම කළ හැකිය.<br><br>සමාජ සජ්ජිතකාරකයන්ට, නියෝජිතායතන කාර්ය මණ්ඩල සේවකයන් හැටියට බාහිර නිරීක්ෂණකයින් වශයෙන් කටයුතු කළ හැකිය. මෙයට ප්‍රජා තලයේදී බිම් මට්ටමේ තත්ත්වයන් ස්ථායී කිරීමට උපකාරී විය හැකිය. එමගින් කල්පවතින ගැටුම් තත්ත්වයන් ඇති විට මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ අවස්ථා අවම කළ හැකි වේ. | බොහෝ රටවල අනුග්‍රාහක ක්‍රම ගොදුරු බවට ලක්වීමට ඉඩකඩ ඇති ජනයාට සමාජ සුරක්ෂාවක් ලබාදෙයි. ආපදා අවස්ථාවන්හි දී දුප්පත් අය ස්ථානීය නායකයන්ගේ සහයෝගය බලාපොරොත්තු වෙති.<br><br>සුදුසු විකල්පයන් සැපයීමකින් තොරව බලගැන්වීම් තුළින් මෙම බැඳීම් ලිහිල් වන්නට ඉඩ තිබේ.<br><br>කේවෙල් කිරීමේ දී පරාජයට පත්වන අය ප්‍රතිචාර දක්වන්නේ කෙසේද ? තමන්ට ලැබිය යුතු කොටස සාධාරණ අන්දමින් නොලැබුණු බව හැඟී ගිය විට දී ගැටුමට සම්බන්ධ එක් පාර්ශවයක් හෝ දේශපාලන අනුග්‍රාකහයන් පටලවන බවට තර්ජනය කරනවා ඇත.<br><br>ගැටුම් පිළිබඳ අතරමැදියන්ගේ පුද්ගලික උවමනාවන් සාමූහික ක්‍රියා සහ බලගැන්වීම් සඳහා වන මූලික ශක්තීන් වෙනස් මගක යැවිය හැකිය. සිවිල් යුද්ධයක ගැටුමට සම්බන්ධ පාර්ශවයන් බලගන්වන ලද ගැමියන් සිටීම ගැන උනන්දු නොවනවා ඇත. නැතහොත්, ග්‍රාමීය කණ්ඩායම් මත ආරෝපණය කිරීමට ප්‍රයත්න දැරීමට ඉඩ ඇත. ඒ අනුව ඔවුන්ගේ ස්වාධීනත්වයට හානි සිදුවීමට ඉඩ තිබේ. |



**උභයාවේගිකතාව**

සමහර කරුණු බලගැන්වීම් හේතුකොටගෙන අනික් ඒවා බල රහිත වීමට ඉඩ තිබේ (ලිංගිකභාවය, පන්තිය, වාර්ගිකත්වය, කුලය). එවිට පරාජිතයා කවුද? ආධාර මැදිහත්වීම් ලැබීමෙන් ජයගන්නේ කවුද?

- ආධාර දෙන නියෝජිතායතන අභ්‍යන්තරයේ තිබෙන්නා වූ බල අසමමිතිත (විදේශිකයන්ට එරෙහිව දේශීය කාර්ය මණ්ඩල) ස්ථානීය බලගැන්වීම් ක්‍රියාවලි හඳුනා දීමට සහ පෝෂණය

කිරීමට ගන්නා වූ ඕනෑම ඒකාබද්ධ ප්‍රයත්නයකට එළදායී විරෝධී වෙයි.

- සහභාගීවීමෙන් ගැටුම් නිරාකරණයට සහයෝගයක් දිය හැකිය. නමුත් ඒ හේතුවෙන්ම අලුත් ගැටුම් හට ගැන්වීම හෝ පවත්නා ආතති උග්‍ර කරවීම සිදුවිය හැකිය.
- තාක්ෂණික සහයෝගතා නියෝජිතායතන බොහෝ විට තමන්ම හඳුන්වා ගනු ලබන්නේ නිර්දේශපාලන සේවා ආයතන වශයෙනි. ඔවුන් සමහර විට සහභාගිකත්ව ප්‍රවේශයක් අනුගමනය කිරීමේ දී පරීක්ෂාකාරී විය හැකිය. ඔවුන් එසේ කරන්නේ සමහරවිට ඔවුන්ට ස්ථානීය සහ ප්‍රාදේශික බල අරගලයන්ට පැටලීමට සිදුවිය හැකි බැවිනි. එය ඔවුන්ගේ කාර්යභාරය අභිබවා යාමක් වේ.
- සමාජ දේශපාලන පද්ධතිය තුළ සිටින සෑම ක්‍රියාකාරිකයෙක් ම තරමක් දුරට පක්ෂග්‍රාහී වේ. සංවර්ධන නියෝජිතායතනය බොහෝ විට කටයුතු කරන්නේ ප්‍රතිරූපීය සංවිධාන මගිනි; ගැටුමකදී ඔවුන් සම්බන්ධ වී ඇත්තේ කුමන පාර්ශවයකට ද? සමහර සමාජ සහ වාර්ගික කණ්ඩායම් සංවිධාන තම මතයට අනුව හසුරුවත්ද? සමහර සංවිධාන සමඟ වැඩ කිරීමටත් සමහර ඒවා නොසලකා හැරීමටත් තීරණය කිරීමෙන් ඔවුන් ස්ථානීය ආයතන අතර හොඳ සහ නරක වශයෙන් පහසුවෙන්ම හංවඩු ගැසීමට ඉඩ තිබේ.



## 7. නිගමනයඃ සංකීර්ණ වූ හදිසි තත්වයන්හී සංවර්ධන නියෝජිතායතන දේශපාලන ක්‍රියාකාරීන් හැටියට

මෙම පරිච්ඡේදයේ, අප සාකච්ඡා කළේ සංවර්ධන නියෝජිතායතනවලට දේශපාලන ක්‍රියාකාරීන් මෙන් සාධාරණ අන්දමින් කෙතරම් දුරට ක්‍රියාත්මක විය හැකිද යන කාරණය ගැනයි. එහි දී සංකීර්ණ වූ හදිසි අවස්ථා තත්ත්වයන්ට මැදිහත් වීම සමහර විට කණ්ඩායම් බලගැන්වීම සඳහා දායක වීම සහ සියල්ල අඩංගු පුරවැසිකම ප්‍රවර්ධනය කිරීම තුළින් ස්ථානීය ප්‍රජාවන් සංවර්ධනය කිරීම යන කරුණු සැලකිල්ලට ගැනේ.

සංවර්ධන ව්‍යාපෘති සන්දර්භය තුළ සාමාන්‍ය සහභාගිකත්ව සහ බලගැන්වීමේ ප්‍රවේශයන්ගේ න්‍යායාත්මක පදනම් අපි සමාලෝචනය කළෙමු. එමෙන්ම ගැටුම් ව්‍යාවර්තන කතිකාවෙන් අවධාරණය කර ඇති පරිදි ආධාර දෙන නියෝජිතායතනවල සාම්ප්‍රදායික කළමනාකරණ තර්කය සහ (ස්ථානීය) බලගැන්වීමේ අවශ්‍යතා අතර, ගැළපුම පිළිබඳ ප්‍රශ්නය ද අපි ගවේෂණය කළෙමු. සහභාගිකත්ව සහ බලගැන්වීමේ ප්‍රවේශයන්ගේ ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීම - එනම් සහභාගිකත්ව ග්‍රාමීය ඇගැයුම් හෝ සමාජ සජ්ජීතකරණය වැනි දේ - නන් අයුරින් පැහැදිලි කරනු ලබන්නේ මෙම ආරම්භක විමුක්ති දායකත්ව ප්‍රවේශයන්ගේ උපයෝගී අවබෝධයයි. මේ ආකාරයෙන් තේරුම්ගත විට දී බලගැන්වීම බොහෝ විට ව්‍යාපෘති සැලසුම් කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ කාර්යයට ජනතාව බද්ධ කරන්නා වූ සරල තත්වයකට පත් වේ.

සංකීර්ණ වූ හදිසි අවස්ථා තත්ත්වයන් ඇතුළත මැදිහත්කරුවන් විසින් සහභාගීකත්ව සහ බලගැන්වීම් සඳහා වූ ඉඩකඩ සුපරීක්ෂ්‍යාකාරීව ඇගැයුමකට ලක් කළ යුතුය. අප හැකියාවන්, බාධක, ජයග්‍රහණ පිළිබඳ කතා, හානිදායක ක්‍රියා කිරීමෙන් වැළකී සිටීම පිළිබඳ කතා සහ සංකීර්ණ වූ හදිසි අවස්ථා තත්ත්වයන් ඇතුළත ආධාර මැදිහත්වීම් සම්බන්ධ උභතෝකෝටිකයන් සිත්හි රඳවා ගනිමින් තවදුරටත් අවධාරණය කිරීමට අවශ්‍ය වන්නේ මූලික වශයෙන් වියත් උපයෝගී ක්‍රමෝපාය තුළින් ගැටුම් ව්‍යාවර්තනය කෙරෙහි යොමු වෙමින් අවබෝධයකින් යුතුව බලගැන්වීමේ ක්‍රියාවලි ප්‍රවර්ධනය කිරීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නැවත ගොඩනැංවීමට ආධාර සපයන නියෝජිතායතන ඉදිරිපත්වීම කෙතරම් වැදගත් ද යන වගයි.

"ප්‍රජාතන්ත්‍රකරණය ජනතාවට තම අවශ්‍යතා සහ ඕනෑ එපාකම් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමට හැකියාව ලබාදෙයි. එමෙන් ම නොවැදගත් සේ සලකා කොන් කරන ලද කණ්ඩායම්වල සහ වඩාත් ගොදුරු බවට ලක්විය හැකි අයගේ අයිතිවාසිකම් සහ අපේක්ෂා ආරක්ෂා කර ගැනීමට ද හැකියාව ලැබේ" (OECD/ DAC 1997, P. 30). "මෙම ක්ෂේත්‍රයේදී ආධාර සහයෝගිතාව යෙදවිය යුත්තේ, යුක්ති සහගත සහ තිරසාර සංවර්ධනය පුළුල්ව ප්‍රවර්ධනය කිරීමේ කාර්යයේ කොටසක් වශයෙනි. එහිදී ගොදුරු බවට ලක් විය හැකි සහ වරප්‍රසාද නොලත් කණ්ඩායම්වලට ඔවුන් සතු මානව සහ නෛතික හිමිකම් පිළිබඳව මෙන්ම පුරවැසිභාවය හා සම්බන්ධ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව ද අවබෝධයක් ලබාදිය යුතුවේ" (එම, 40 පිටුව).

සත්‍ය වශයෙන්ම සියල්ල අඩංගු පුරවැසිභාවයක සංවර්ධනයට උදව් කිරීම සඳහා ආධාර මැදිහත්වීම්වල බලගැන්වීම් ප්‍රවේශ විසින් පිළිගැනීමක් ලබාදීම සඳහා වූ තවත් බොහෝ අංග ඇතුළත් කළ යුතුය. පිළිගැනීමක් ලබාදීමේ එවැනි ක්‍රියාවලි ගැමි ප්‍රජාවේ මායිම්වලින් ඔබ්බට යන සේ පහසුකම් සැලසීම අවශ්‍යවේ. ස්ථානීය තලයේ දී සිව්වන ව්‍යාපෘති මැදිහත්වීම් පළාත් ආණ්ඩු ආයතන සහ රාජ්‍ය නොවන සංවිධානවල අතරමැදි තල සමග සම්බන්ධ කිරීමට ක්‍රම සොයා ගැනීම අවශ්‍ය වේ. මෙහිදී සැමවිටම කල්පනාවට ගත යුත්තේ මැදිහත්වීමේ සමස්ත ක්‍රමෝපාය සහ ගැටුම් සන්දර්භයේ වැදගත්කමයි. සංවාද සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රාදේශීය තලයේ දී සහයෝගතා ජාලයන් ප්‍රවර්ධනය කිරීම බලගැන්වීමේ සහ පිළිගැනීමට ලක් කිරීමේ ක්‍රියාවලි පණ ගැන්වීමට ද ප්‍රයෝජනවත් වනු ඇත. මෙම තත්ත්වයන් හේතු කොට ගෙන මහා පරිමාණ ගැටුම් සඳහා හේතුවන ප්‍රධාන හේතූන් සමහරක් ව්‍යාවර්තනය කිරීම සඳහා ප්‍රවේශවීමට අවස්ථාවක් වශයෙන් පත්විය හැකිය.

එහෙත් විවෘත කරුණු කිහිපයක් ඉතිරි වී තිබේ. මෙම ප්‍රශ්නවලට පිළිතුරු සොයාගැනීම සඳහා සංකීර්ණ වූ හදිසි අවස්ථා තත්ත්වයන් ඇතුළත ආධාර පිළිබඳ ප්‍රතිපත්තිවල හොඳම ක්‍රියාමාර්ග වඩාත් සවිස්තරව විශ්ලේෂණය කිරීමක් අවශ්‍ය වේ. මෙහිදී ප්‍රජාව වෙත මෙන්ම ප්‍රාදේශීය සහ ජාතික වශයෙන් වූ මැදිහත්වීමේ අදහස ගැන අවධානය යොමු විය යුතු වේ:

- (ස්ථානීය) බලගැන්වීම පිළිබඳ තර්කයක් පිළිගැනීම සඳහා වන ඔවුන්ගේ ප්‍රයත්නයේ දී වැඩි නම්‍යතාවයක් ලබා ගනිමින්, ආධාර නියෝජිතායතන ඔවුන්ගේ පරිපාලන ක්‍රියාපටිපාටිවල සීමාවන් ඉක්මවා යා යුත්තේ කෙසේද?
- සංකීර්ණ වූ හදිසි අවස්ථා තත්ත්වයන්හි සංවර්ධන ආධාර පිළිබඳ සන්දර්භය සම්බන්ධයෙන් ගත් කල ප්‍රජා සහ ප්‍රාදේශීය තලයන්හිදී බලගැන්වීමේ සහ පිළිගැනීමට ලක් කිරීමේ ක්‍රියාවලිවලට

පහසුකම් සැලසීම සඳහා අනුගමනය කළ යුතු හොඳම ක්‍රියාමාර්ග මොනවාද?

- සංකීර්ණ වූ හදිසි අවස්ථා තත්ත්වයන්හි දී මුහුණ පෑමට සිදු වූ උභතෝකෝටිකයන් පිළිබඳව ආධාර දෙන අපගේ අත්දැකීම්වලින් පාඩම් ඉගෙන වියත් උපයෝගීතාවක් සඳහා නියෝජිතායතන හැකියාවන් ගොඩනංවන්නේ කෙසේද?

## 8. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම


Azar, E. 1990. *The Management of Protracted Social Conflict: Theory and Cases,* Aldershot: Dartmouth Publishing.

Anderson, Mary B. 1999. *Do No Harm: How Aid Can Support Peace – or War,* Boulder, CO: Lynne Rienner Publishers.

Baruch Bush, Robert A. and J. P. Folger 1994. *The Promise of Mediation. Responding to Conflict Through Empowerment and Recognitio*n, San Francisco: Jossey-Bass Publishers.

Bastian, Sunil and Nicola Bastian (eds.) 1996. *Assessing Participation. A Debate from South Asia,* New Delhi: Konark Publishers.

Bauer, Eberhard et. al. 1999. *Food Security and Conflict. A Participatory Development Concept for the Integrated Food Security Programme,* Berlin: Seminar für Ländliche Entwicklung.

Bauer, Eberhard, Christine Bigdon and Benedikt Korf 2000. "Anspruch und Wirklichkeit in der Konfliktbearbeitung: Was kann Entwicklungszusammenarbeit wirklich leisten? Das Beispiel Sri Lanka," *Peripherie 79, 43-68.*

Bauer, Eberhard and Volker Hoffmann 1997. "Participatory Rural Appraisal (PRA): Challenges and Recommendations," *Quarterly Journal of International Agriculture,* XXXVI, 1, 81-99.





Berthoin, A., M. Dierkes, J. Child, and I. Nonaka, (eds.) 2001. *Handbook of Organisational Learning and Knowledge,* Oxford: Oxford University Press.

Blackburn, James and Jeremy Holland (eds.) 1998. *Who Changes? Institutionalizing Participation in Development,* London: Intermediate Technology Publications.

Bigdon, Christine and Antonia Engel 2000. *Social Mobilization Concept for IFS,* Working Paper 28, Trincomalee: Integrated Food Security Programme Trincomalee (IFSP).

Bush, K. 1998. *A Measure of Peace: Peace and Conflict Impact Assessment of Development Projects in Conflict Zones,* Working Paper No 1, The Peace Building and Reconstruction Programme Initiative and the Evaluation Unit, Ottawa: International Development Research Centre.

Burton, J. (ed.) 1990. *Conflict: Human Needs Theory,* New York: St. Martin‘s Press.

Chambers, Robert 1994a. "The Origins and Practice of Participatory Rural Appraisal," *World Development,* XXII, 7, 953-969.

Chambers, Robert 1994b. "Participatory Rural Appraisal (PRA): Analysis of Experience," *World Development,* XXII, 9, 1253-1268.

Chambers, Robert 1994c. "Participatory Rural Appraisal (PRA): Challenges, Potentials and Paradigm," *World Development,* XXII, 10, pp1437-1454.

Chambers, Robert 1995. "Paradigm Shifts and the Practice of Participatory Research and Development," *in* Nelson and Wright, op.cit., 30-42.

Chambers, Robert and Irene Guijt 1995. "PRA – Five Years Later. Where are We Now?" in *Forests, Trees and People Newsletter* 26/27, pp4-13.

Fahrenhorst, Brigitte (ed) 2000. *Die Rolle der Entwicklungszusammenarbeit in gewalttätigen Konflikten,* Berlin: SID.

Fisher, Roger and William Ury 1981. *Getting To Yes: Negotiating Agreement Without Giving In,* Boston: Houghton Mifflin.

Freire, P. 1972. *Pedagogy of the Oppressed,* London: Penguin.

Goodhand, J. and D. Hulme 1999. "From Wars to Complex Political Emergencies: Understanding Conflict and Peacebuilding in the New World Disorder," *Third World Quarterly,* XX, 1, 13-26.

Goodhand, J. and N. Lewer 1999. "Sri Lanka: NGOs and Peacebuilding in Complex Political Emergencies," *Third World Quarterly,* XX, 1, 69-87.
GTZ 2001. *Krisenprävention und Konfliktbearbeitung,* Eschborn: GTZ.
Heinrich, Wolfgang 1999. "Förderung von Friedensprozessen durch Entwicklung und Zusammenarbeit. Lokale Friedenspotentiale müssen genutzt werden," *Entwicklung und Zusammenarbeit,* XXXX, 4, 106-109.
Klem, B. 2001. *Coping with Chaos. Dilemmas of assistance in the war-torn areas of Sri Lanka,* Nijmegen: Centre for International Development Issues.
Korf, Benedikt 2000a. "Ökonomie der Zeit – Über Wege zu Wassermühlen, Partizipation und Gender," *Entwicklungsethnologie,* IX, 1, 28-42.
Korf, Benedikt 2000b. *Promoting Communication and Dialogue. Review of Community Mobilization,* Working Paper 32, Trincomalee: Integrated Food Security Programme Trincomalee (IFSP).
Lederach, J.P. 1995. *Preparing for Peace: Conflict Transformation Across Cultures,* Syracuse, NY: Syracuse University Press.
Miall, Hugh, Oliver Rambotham and Tom Woodhouse 1999. *Contemporary Conflict Resolution*, Cambridge: Polity Press.
Moser, Caroline 1993. *Gender Planning and Development. Theory, Practice and Training,* London: Routledge.
Nelson, Nici and Susan Wright (eds.) 1995. *Power and Participatory Development. Theory and Practice,* London: Intermediate Technology Publications.
OECD/DAC 1997. *Development Assistance Committee. Guidelines on Conflict, Peace and Development Cooperation,* Paris: OECD Publications.
Ross, M.H. and J. Rothman (eds.) 1999. *Theory and Practice in Ethnic Conflict Management: Theorizing Success and Failure,* London: Macmillan Press.
Rothman, J. and V.J. Friedman 2001. "Identity, Conflict, and Organisational Learning," *in* Berthoin et al.,op. cit., 582-597.
Sachithanandam, S. 1996. "Participatory Approaches to Development under Civil War Conditions. The Experience in Batticaloa, Sri Lanka 1991-1995," *in* Bastian and Bastian, op. cit.
Schlichte, Klaus 2000. "Die Entwicklungszusammenarbeit und die Dynamik von gewaltsamen Konflikten," *in* Brigitte Fahrenhorst, op. cit., 45-54.
Sen, G. and C. Grown 1988. *Development, Crisis, and Alternative Visions: Third World Women's Perspectives,* London: Earthscan.
Shah, P. and M.K. Shah 1995. "Participatory Methods: Precipitating or Avoiding Conflict?" *PLA Notes*, 24, 48-51.



**Selected Manuals for PRA:**

Berg, Christian et al. 1997. *Introduction of a Participatory and Integrated Development Process (PIDEP) in Kalomo District, Zambia. Vol. II: Manual for Trainers and Users of PIDEP,* Berlin: Seminar für Ländliche Entwicklung.
Korf, Benedikt 2000c. *Field Guide to Participatory Needs Assessment,* Technical Paper 6, Trincomalee: Integrated Food Security Programme Trincomalee (IFSP).
Pretty, J., Irene Guijt, J. Thompson and Ian Scoones 1995. *A Trainer's Guide for Participatory Learning and Action*, London: International Institute for Environment and Development (IIED).
Schönhuth, Michael and Uwe Kievelitz 1993. *Participatory Learning Approaches. Rapid Rural Appraisal, Participatory Appraisal* (Schriftenreihe der GTZ 248) Eschborn:GTZ.
Schubert, Bernd et al. 1994. *Facilitating the Introduction of a Participatory and Integrated Development Approach (PIDA) in Kilifi District, Kenya. Vol. II: From Concept to Action: A Manual for Trainers and Users of PIDA,* Berlin: Seminar für Ländliche Entwicklung.
Various issues of the journal *PLA Notes* (earlier: RRA Notes), which publishes firsthand field experience with PLA. *PLA Notes* is edited by the International Institute for Environment and Development (IIED), London.